# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

# ஸ்ரீலங்கா சீமெந்துக் கூட்டுத்தாபனம

# SRI LANKA CEMENT CORPORATION

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

## வருடாந்த அறிக்கை மற்றும் கணக்குகள

## ANNUAL REPORT AND ACCOUNTS

## 2020

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## වාර්ෂික වාර්තාව හා ගිණුම්

**2020**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව,
නො. 27, වොක්ෂෝල් මන්දිරය,
වොක්ෂෝල් පාර,
කොළඹ - 02.

2022.08.

ලේකම්තුමා,
කර්මාන්ත අමාත්‍යාංශය,
73/1, ගාලු පාර,
කොළඹ - 03.

ලේකම්තුමනි,

**<u>2020 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව හා ගිණුම් - ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව</u>**

1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(1) වගන්තියේ නියමයන්ට අනුකූලව පහත සඳහන් ලේඛන සමග 2020 වර්ෂය සඳහා වූ සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමග ඉදිරිපත් කරමු.

අ) 2020 වර්ෂයේ මූල්‍ය වාර්තා
ආ) විගණකාධිපති වාර්තාව
ඇ) යථෝක්ත (ආ) පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම

ස්තූතියි.

මෙයට විශ්වාසී,

*අත්සන් කලේ,*
**නිතීඥ ගාමිණී ඒකනායක**
**සභාපති**
**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

| | අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 01 – 04 |
| 02 | සංස්ථාව පිළිබඳ තොරතුරු | 05 |
| 03 | ආයතනික තොරතුරු - අධ්‍යක්ෂ මණ්ඩලය | 06 |
| 04 | මානව සම්පත් පිළිබඳ තොරතුරු | 07 |
| 05 | සභාපතිතුමාගේ වාර්තාව | 08 - 09 |
| 06 | ආයතනික තොරතුරු - ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව | 10 |
| 07 | විගණන කමිටුවේ වාර්තාව - 2020 | 11 |
| 08 | විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව - 2020 | 12 – 20 |
| 09 | 2020.12.31ට මූල්‍ය තත්ව ප්‍රකාශනය | 21 |
| 10 | 2020.12. 31න් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 22 |
| 11 | 2020.12. 31ට හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය | 23 |
| 12 | 2020.12. 31ට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 24 |
| 13 | 2020.12.31න් අවසන් වර්ෂයේ මූල්‍ය වාර්තා සඳහා ගිණුම්කරණ සටහන් හා ප්‍රතිපත්ති | 25-34 |
| 14 | 2020.12.31න් අවසන් වර්ෂයේ ගිණුම්කරණ සටහන් සඳහා සවිස්තරාත්මක සටහන් | 35-37 |
| 15 | 2020 වර්ෂය සඳහා ආදායම් බදු ගණනය කිරීම් සටහන් | 38-39 |
| 16 | 2020 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැක්වීම් | 40-41 |
| 17 | 2016 – 2019 දක්වා වසර 4ක් සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශනය | 42 |
| 18 | 2016 – 2019 දක්වා වසර 4ක් සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 43 |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
## <u>2020 වර්ෂය සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව</u>

# 1.0 පසුබිම

1950 වර්ෂයේදී කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක කරන ලද කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි.

1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි. කර්මාන්ත හා විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අප සංස්ථාව 1985 පෙබරවාරි 01වන දින සිට පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත පවරා ගන්නා ලදි. ඉන් පසු 1997 ජුනි 19 වන දින සිට 2010 අප්‍රේල් මාසය දක්වා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී ඉන් අනතුරුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා 2015 පෙබරවාරි මාසය දක්වා එම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විය. ඉන් පසු කර්මාන්ත හා වාණිජ කටයුතු ,දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම ,සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වී 2019 නොවැම්බර් මස සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

# 2.0 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

**දැක්ම**

"ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන පහසුකම් සැපයීම සහ එහි පුරෝගාමියා වශයෙන් මගපෙන්වීම් කිරීම"

**මෙහෙවර**

"ගුණාත්මකභවින් යුතු සිමෙන්ති සහ සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන රටේ පවතින අවශ්‍යතාවයට සරිලන පරිදි සැපයීම"

**ප්‍රධාන පරමාර්ථ**

සංස්ථාවේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව නැවත ආරම්භ කිරීම වේ.
එසේම, සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමද සංස්ථාවේ අරමුණු අතර වේ.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංස්ථාවේ කාර්යන් හා පරමාර්ථ ලෙස පහත දෑ ප්‍රකාශයට පත් කර ඇත.

- සිමෙන්ති නිෂ්පාදනය හා විකිණීම
- සිමෙන්තියෙන් හෝ කොන්ක්‍රීට් වලින් නිෂ්පාදනය කරනු ලබන දුරකථන සහ විදුලි පණිවුඩ හුවමාරු කණු, දුරකථන කුටි, ජලය ගෙන යන උපකරණ, හියුම් නල සහ ටයිල් නිෂ්පාදනය ආදීය නිපදවීම හා අලෙවි කිරීම
- ඕනෑම පුද්ගලයෙකුට විදුලි බලය තොග වශයෙන් සැපයීම

එසේම, 1964 මැයි 11 දිනැති අංක 14033 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් 1959 ජනවාරි 02 දිනැති අංක 11634 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද "සිමෙන්ති නිෂ්පාදනය හා බෙදාහැරීම" වෙනුවට " සිමෙන්ති නිෂ්පාදනය, ආනයනය කිරීම හා විකිණීම" ලෙස ඇතුලත් කරන ලදි.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වල රු.1,083,618,910/-ක් 1981දී ආයෝජනය කරන ලද අතර එහි කොටස් ප්‍රාග්ධනයෙන් 62.45%ක හිමිකාරීත්වය දරනු ලැබේ. කොටසක සම මිල රු.10/-ක් වේ. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී එහි කොටසක වෙළඳ පොළ අගය රු.8.20ක් වූ අතර එම වර්ෂයේම දෙසැම්බර් මාසයේදී එහි අගය රු.7.90ක් විය.



මෙම ආයෝජනයට අදාල ප්‍රතිලාභ මෙතෙක් සංස්ථාවට ලැබී නොමැත. 2016 පෙබරවාරි 25 සිට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා ලංකා සිමෙන්ති සමාගම අධ්‍යක්ෂ මණ්ඩල දෙකක් යටතේ වෙන වෙනම ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, සීමාසහිත ලෆාර්ජ් මහවැලි මෙරීන් සිමෙන්ති සමාගමේ කොටසක අගය රු. 10/-ක් වූ කොටස් 320,000ක ආයොජනයක් සිදු කර ඇති අතර 1995 දෙසැම්බර් 31 දින එම කොටස් දෙකකට එකක් ලෙස වූ ප්‍රසාද කොටස් නිකුතුවෙන් පසු එම සමාගමේ මුළු කොටස් හිමිකාරීත්වය 480,000ක් විය. එය මුළු කොටස් හිමිකාරීත්වයෙන් 10%ක් වේ.මෙම ආයොජනයට අදාලව 1999දක්වා ප්‍රතිලාභ සංස්ථාවට හිමිවුනි. නැවත 2014 වර්ෂයට අදාලව රු.1,728,000/-ක් ලාභාංශ වශයෙන් 2015 වර්ෂයේදී හිමි විය.

## 3.0 වර්තමාන තත්වය

සංස්ථාව සතුව තිබූ පුත්තලම සිමෙන්ති කර්මාන්තශාලාව හා රුහුණු සිමෙන්ති කර්මාන්තශාලාව ජනතාකරණයට භාජනය වීමත්, මට්ටක්කුලියේ පිහිටා තිබූ කඩදාසි මළු ඒකකයේ අයිතිය මහාභාණ්ඩාගාරයට මාරු කිරීම නිසාත්, දැනට සංස්ථාව සතු වනුයේ කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්තශාලාව පමණි. එම කර්මාන්තශාලාවද උතුරේ පැවති යුධමය වාතාවරණය හේතුවෙන් 1990 ජුනි මස සිට වසා දමා ඇති අතර එම භූමිය මේ වන විටත් ශ්‍රී ලංකා යුධ හමුදාව යටතේ පවතී.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු කන්කසන්තුරේ පිහිටි ඉඩම් නිදහස් කරගැනීමටත් නැවත එහි සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමටත් කිහිපවිටකදීම උත්සාහ කලද එය නිෂ්පල විය. එසේම, ආරක්ෂක අංශයන්ගේන් මෙම ඉඩම් නිදහස් කරගැනීමෙන් අනතුරුව නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය පසුබිම ඇතුලත් වාර්තා සකස් කර ආදාළ පාර්ශව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

සිමෙන්ති නිෂ්පාදන කටයුතු නවතා දමා ඇති බැවින් සංස්ථාව විසින් 2008 වර්ෂයේ සිට සාමාන්‍ය පොට්ලන්ඩ් සිමෙන්ති ආනයනය කර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වූ අතර 1997 වර්ෂයේ සිට කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීමේ නිරත විය.

2016 වර්ෂයේදීද මහා භාණ්ඩාගාරය විසින් හදුන්වාදෙනු ලැබූ ස්වේච්ජා වන්දි යෝජනා ක්‍රමය යටතේ සේවකයින් 36 දෙනෙකු 2016.07.31 දිනට විශ්‍රාම යන ලදි.

(අ) සිමෙන්ති ආනයනය හා අලෙවිය :
අවම මිලකට ඉහළ ගුණත්වයෙන් යුතු සිමෙන්ති අවසන් පාරිභොගිකයා වෙත සැපයීම සඳහා 2008 වර්ෂයේ සිට සිමෙන්ති ආනයනය කර "කන්කේසන්" වෙළඳ නාමය යටතේ අලෙවි කිරීම සිදු කරන ලදි. 2008 වර්ෂයේ සිට 2012 සංස්ථාව විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 219,559ක් ආනයනය කර ඇත.

2013 සහ 2014 වර්ෂයන්හිදී සංස්ථාව විසින් සිමෙන්ති මෙට්‍රික් ටොන් 20,300ක් සහ මෙට්‍රික් ටොන් 18,900 ක් ආනයනය කර ඇත. එසේම, සිමෙන්ති මෙට්‍රික් ටොන් 1,540ක් හා මෙට්‍රික් ටොන් 3,815ක් පිළිවෙලින් 2015 හා 2016 යන වර්ෂ වලදී ආනයනය කර ඇත.

2017 වර්ෂයේදී සිමෙන්ති මෙට්‍රික් ටොන් 980ක් පමණක් ආනයනය කර අතර සිමෙන්ති අලෙවි කිරීම සඳහා පළපුරුදු සේවකයින් නොමැති වීම සහ මූල්‍යමය අපහසුතා මත සිමෙන්ති ආනයනය කර විකිණීම් කටයුතු තාවකාලිකව නවතා ඇත.

<u>සිමෙන්ති අලෙවිය</u>

| **වර්ෂය** | **2018, 19සහ 20** | **2017** | **2016** | **2015** |
|---|---|---|---|---|
| ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) | - | 980 | 4,002 | 2,780 |
| **වටිනාකම (රු.මිලියන)** | - | 12.66 | 60.15 | 37.87 |

(ආ) **කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම හා අලෙවිකිරීම :**

කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් සිදු කිරීම 1997 ඔක්තෝබර් මාසයේදී සංස්ථාව විසින් උරුම්පිරායි ප්‍රදේශයේ ආරම්භ කර ඇත. මෙමගින් ප්‍රධාන වශයෙන් ලංකා විදුලි බල මණ්ඩලය සහ ශ්‍රී ලංකා ටෙලිකොම් යන ආයතන වලට කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයෙහි නිරත වී ඇත.



2009 වර්ෂයේදී කොන්ක්‍රීට් රැහැන් ආධාරක කණු නිෂ්පාදනයට අමතරව කොන්ක්‍රීට් ගල්, තලාංද පදිකා වේදිකා ඇතුරුම්, කම්බි කණු යනාදි නිෂ්පාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය, යාපනය විශ්වවිද්‍යාලය සහ සාමාන්‍ය ජනතාව වෙත අලෙවි කිරීම ආරම්භ කරන ලදි.

2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 16,431ක් සිදු කර ඇත.

එසේම 2013 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන 2,003ක්, 1,674 ක් සිදු කර ඇත. 2015 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 191ක්, පන්තල් කණු 832ක් හා කොන්ක්‍රීට් ගල් 71,771ක් නිෂ්පාදනය කර ඇත. එසේම, 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් කණු 168ක්, වැටවල් සඳහා වූ කණු 224ක්, ආර්.සී.කණු 95ක් හා කොන්ක්‍රීට් ගල් 30,122ක් නිෂ්පාදනය කර ඇත.

**කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය**

| වර්ෂය | 2020 | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|---|
| කොන්ක්‍රීට් කණු | - | - | - | - | 304 | - |
| වැටවල් සඳහා වූ කණු | - | - | - | 4 | 253 | 391 |
| ආර්.සී.කණු | - | 114 | 99 | 145 | 169 | 419 |
| කොන්ක්‍රීට් ගල් | - | - | - | - | 46,907 | 54,805 |
| **වටිනාකම (රු.මිලියන)** | **-** | **0.57** | **0.56** | **1.13** | **4.07** | **2.69** |

චක්‍ර ලේඛ අංක 02/2016ට අනුව ක්‍රියාත්මක වූ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය යටතේ කොන්ක්‍රීට් ආශිත නිෂ්පාදන අංගනයේ සේවයේ නියුතුව සිටි සේවකයින් 02 දෙදෙනෙකු හැර අනෙකුත් සේවකයින් 2016.07.31දින සිට විශ්‍රාම යන ලදි.

**(ඇ) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වත්කම්වලින් උපයන ලද කුලී ආදායම්**
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් හුණුගල් අවශ්‍ය පුද්ගලයන් සොයා එම ඉඩම් කල්බදු පදනම මත ලබා දී හා එළඹී තිබෙන ගිවිසුම් යාවත්කාලීන කර ඉන් ආදායම් ඉපයා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදි.

**(ඇ) ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිළිබඳ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග :**
සංස්ථාව සතු කොල්ලුපිටියේ , මන්නාරම, පාලාවි සහ අරුවක්කාළු හි පිහිටා ඇති ඉඩම් සඳහා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ආදායම් ඉපැයුම් මාර්ග බවට එම වත්කම් පරිවර්ථනය කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වේ. ඒ තුලින් සංස්ථාව ස්ථායී හා කාර්යක්ෂම මට්ටමකට ගෙන ඒමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා එහි පරිපාලිත සමාගම වන ලංකා සිමෙන්ති සමාගම ප්‍රතිව්‍යුහගත කල යුතු ආයතන ලෙස හඳුනාගෙන ඊට අදාළ කටයුතු සිදු වෙමින් පවති. එසේම, අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව ලංකා සිමෙන්ති සමාගම සමග ඒකාබද්ධ කිරීමට කටයුතු සිදු වේ. 2016 වර්ෂයේ පෙබරවාරි මස සිට මෙම ආයතන දෙක වෙන වෙනම වූ අධ්‍යක්ෂ මණ්ඩල යටතේ කළමණාකරණය වේ.

## 4.0 ලාභදායීත්වය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව , 2011 වර්ෂයේදී රු.මිලියන 2.6ක ලාභයක් උපයා ඇත. 2012, 2013 හා 2014 වර්ෂ වලදී පිළිවෙළින් රු. මිලියන 75ක්, රු. මිලියන 424ක් හා රු. මිලියන 13ක් ලෙස අලාභ දරා ඇත. නැවත ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව 2015, 2016, 2017 හා 2018 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 4.34ක , රු.මිලියන 31.70ක, රු.මිලියන15.61, රු.මිලියන15.96 හා රු.මිලියන43 ප්‍රකාශිත ගණකාධිකරණ ලාභ උපයාගෙන ඇත.

2020 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 40.7 ක බදු පෙර ලාභයක් උපයා ඇත. එය පෙර වසර හා සැසඳීමේදී 3% වර්ධනයක් පෙන්නුම් කරනු ලැබේ. මෙම වර්ෂයේදී අනෙකුත් ගණකාධිකරණ ගැලපීම් වලින් පසු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ ශුද්ධ ලාභය රු. මිලියන 39.3ක් වේ.

## 5.0 ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අනාගත කාර්යභාරය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව පවතින එකම සිමෙන්ති නිෂ්පාදන කර්මාන්තශාලාව කන්කසන්තුරේ කර්මාන්තශාලාව වන අතර යුධමය වාතාවරණය හේතුවෙන් එය 1990 ජූනි මස වසාදැමීමෙන් පසු මේ වන තුරු සිමෙන්ති නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොමැත. එසේම එහි නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳ පුරෝකථනයක්ද සිදුකල නොහැක. නමුත්, නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීමට අදාල වාර්තා සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.

මෙම කන්කසන්තුරේ කර්මාන්තශාලාව සහිත භූමිය නැවත සිමෙන්ති සංස්ථාවට භාරදෙන ලෙස ඉල්ලීම් කර තිබුනද වර්තමානය වන විටත් එය භාර දීමට ශ්‍රී ලංකා යුධ හමුදාව කටයුතු කර නොමැත. මෙම භූමිය සංස්ථාවට මුදා හැරිමෙන් අනතුරුව ඊට යෝග්‍ය සංවර්ධන කටයුත්තක් ආරම්භ කල හැකිවේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේදී 2016.10.20වන දින පැවති "2016.07.31 දින ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ ආයතන වල ඉදිරි කටයුතු පිළිබඳ" රැස්වීමේදී ගනු ලැබූ තීරණ 2016.10.27 දිනැති අංක MIN/R/07/06/07 දරණ ලිපිය මඟින් දැනුවත් කල අතර ඒ අනුව අප සංස්ථාව සතු කොල්ලුපිටිය,මන්නාරම, පුත්තලම හා කන්කසන්තුරේ පිහිටා ඇති ඉඩම් සඳහා යෝග්‍ය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.

සුදුසු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා සිදුවෙමින් පවතී.

එම සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුලින් ජනිත වන ආදායම් මනා ලෙස කළමණාකරණය කිරීමටත්, ඒ තුලින් සංස්ථාවේ මූල්‍ය තත්වය ශක්තිමත් මට්ටමකට ගෙන ඒමට හා සංස්ථාව ස්ථාවර මට්ටමකට ගෙන ඒමටත් උත්සාහ කරනු ලැබේ.

## 6.0 සේවය ඇගයීම

2020 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ කටයුතු සඳහා ලබාදුන් මගපෙන්වීම් සම්බන්ධව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාහට අධ්‍යක්ෂ මණ්ඩලයේ ගෞරවනීය ස්තූතිය පුද කර සිටින අතර සංස්ථාවට ලබාදුන් සහයෝගය වෙනුවෙන් රේඛිය අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ, රාජ්‍ය බැංකුවල හා අනෙකුත් රජයේ ආයතන වල සේවයේ නියුතු සියලු නිලධාරීන්ට අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

එසේම, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සේවයේ නියුතු සේවකයින්හටද අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තූතිය පුද කර සිටිමු.

## ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව පිළිබඳ තොරතුරු

***<u>ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව</u>***

**<u>ප්‍රධාන කාර්යාලය</u>**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

**දුරකථන අංක** : 0112 440 201 , 0112 440 203 හා 0112 440 205
ෆැක්ස් අංක : 0112 448 866

**<u>කොන්ක්‍රීට් ආශ්‍රීත නිෂ්පාදන අංගනය</u>**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව, උරුම්පිරායි, යාපනය.
**දුරකථන අංක** : 0213 215 340

**<u>බැංකුකරුවෝ</u>**

ලංකා බැංකුව, මහජන බැංකුව

**<u>විගණකවරු</u>**

විගණකාධිපති දෙපාර්තමේන්තුව, අංක.306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.

***<u>පරිපාලිත සමාගම - ලංකා සිමෙන්ති සමාගම</u>***

**<u>ප්‍රධාන කාර්යාලය</u>**

ලංකා සිමෙන්ති සමාගම, නො.27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් පාර, කොළඹ 02.

**දුරකථන අංක** : 0112 447 746, 0112 399 243
ෆැක්ස් අංක : 0112 447 541

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි වේ.**

| | | | |
|---|---|---|---|
| 01. ගාමිණී ඒකනායක මහතා | සභාපති | - | 01.01.2020 දින සිට |
| 02. ඊ.ඒ.එස්.සුරංග මහතා | අධ්‍යක්ෂ | - | 01.01.2020 දින සිට |
| 03. ජී.එල්.චමින්ද ජයලාල් මහතා | අධ්‍යක්ෂ | - | 01.01.2020 දින සිට |
| 04. යූ.එල්.ආර්.සෙනරත් පෙරේරා මහතා | අධ්‍යක්ෂ | - | 06.02.2020 දින සිට |
| 05. එස්.පී.ලොකුහැන්ඩිගේ මහතා | අධ්‍යක්ෂ | - | 26.021.2020 දින සිට |
| 06. ඩබ්.ආර්.පරණගම මහතා | මහාභාණ්ඩාගාර නියෝජිත | - | 16.12.2020 දින සිට |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
# 2020.12.31 දිනට මානව සම්පත් පිරිස් බලය

| වර්ගය | මධ්‍ය මට්ටමේ කළමණාකරුවන් | කණිෂ්ඨ මට්ටෙම් කළමණාකරුවන් | කළමණාකරණ සහකාර | ප්‍රථමික මට්ටම | ඒකතුව |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 01 | 01 | 03 | 07 | 12 |
| | | | | | |
| කන්කසන්තුරේ සිමෙන්ති වැඩබිම | - | - | - | 01 | 01 |
| | 01 | 01 | 03 | 08 | 13 |

## සභාපතිතුමන්ගේ පණිවිඩය

මා 2020 ජනවාරි 1 වන දින ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිවරයා ලෙස පත් වූ අතර එම වසරේ මාර්තු මාසයේදී කොවිඩ් - 19 ආරම්භ වූ අතර ඒම මුදල් වර්ෂය (2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන්) පුරා අද දක්වා අත්කර ගෙන ඇති මැනිය හැකි සහ මිල කළ නොහැකි දෑ මොනවාද යන්න සඳහන් කිරීමට මම ආඩම්බර වෙමි.

පහත සඳහන් කර ඇති මෙම සැලකිය යුතු ජයග්‍රහණ කිහිපයක් ඉස්මතු කරන්නෙමු :

තවත් මෙහෙයුම් කාලසීමාවක් දීර්ඝ කිරීමට ලංසු ඉදිරිපත් කරන දැනට සිටින විදේශීය ආයෝජකයා ඉවත් කර අරුවක්කාලු නිධියෙහි පවත්නා "ඉල්මනයිට්" සැකසීම සඳහා ලංකා ඛණිජ වැලි සමාගම සමඟ හවුල් ව්‍යාපාරයක් පිහිටුවීමට කටයුතු කර ඇත. ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට මේවන විට කොටස් 40%ක් හිමි වන අතර ලංකා ඛණිජ වැලි සමාගමට ව්‍යාපාරයෙන් 60%ක් හිමිවේ. අරුවක්කාලු හි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇති ඉඩමෙන් කොටසක් විනාශ වී ආක්‍රමණයට ලක් වූ විට නැවත ඒවැනි අනාගත විනාශයක් සිදු නොවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සහ වැළැක්වීමේ පියවර ගන්නා ලදී. වඩා ඵලදායිතාවය අත්පත් කරගැනීම සඳහා පවතින ක්‍රමය ප්‍රතිව්‍යුහගත කිරීම සහ කොල්ලුපිටියේ පිහිටි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් ඉඩමෙන් ආදායම් ඉපැයීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අතීතයේ පැවති කීර්තිමත් තත්වය නැවත ගෙන ඒමේ අදහසින් අපනයන කණ්ඩායමක් සමඟ එක්ව නැවත වරක් සිමෙන්ති නිෂ්පාදනය කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇති බව මෙම අවස්ථාවේදී සඳහන් කිරීමට මම ආඩම්බර වෙමි. මේ සඳහා දැනට පවතින යන්ත්‍ර සූත්‍ර, කම්හල් සහ ගොඩනැගිලි තොග ලබා ගැනීම සඳහා අපි කන්කසන්තුරේ වෙත සංචාර කිහිපයක් සිදු කර ඇති අතර මේ සම්බන්ධයෙන් පුළුල් සමීක්ෂණයක් අවසන් කර ඇත.

නිෂ්පාදනය, ආනයනය, අලෙවිකරණය සහ පරිසරය සුරැකීම මෙන්ම දැරිය හැකි මිල පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වකරුවන් අනුගත විය යුතු උපාය මාර්ගයක් සැකසීමට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව මූලිකත්වය ගත යුතුය.

තවද, සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන වන ගඩොල්, ආවරණ ද්‍රව්‍ය, උළු වැනි දෑ සඳහා වැඩි අවස්ථා නිර්මාණය කරමින් අඩු වරප්‍රසාද ලත් සමාජය, විශේෂයෙන් ගම් මට්ටම් සවිබල ගැන්වීමේ උපාය මාර්ගයක් නිර්මාණය කර සැලසුම් කළ යුතුය. ඒ හා සමානව, මෙය මැටි සහ අනෙකුත් ආකලන දක්වා ව්‍යාප්ති දැක්විය හැකිය.

දැනට ශ්‍රී ලංකාවේ (පුත්තලම නිෂ්පාදනාගාරය) පවතින්නේ එක් ඒකාබද්ධ නිෂ්පාදනාගාරයක් පමණක් වන අතර, කන්කසන්තුරේ හෝ හුණුගල් තීරය ආසන්නයේ තවත් සම්පූර්ණ ඒකාබද්ධ නිෂ්පාදනාගාරයක් විවෘත කිරීමෙන් රටට විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කර ගැනීමට හැකි වේ.

භූ විද්‍යා සමීක්ෂණයට අනුව, හුණුගල් (ක්ලින්කර් නිෂ්පාදනය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය වීම) නිධි පිහිටා ඇත්තේ කන්කසන්තුරේ සහ පුත්තලම ප්‍රදේශයවල වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ඇයට අහිමි වූ කීර්තිය නැවත ලබාගෙන ප්‍රමුඛයා ලෙස නැවත පැමිණ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය, ක්ලින්කර් සහ සිමෙන්ති ආනයනය, සැපයුම සහ ඉල්ලුම සහ නිෂ්පාදනයේ සියලු අංශවල එකම අධිකාරිය බවට පත්විය යුතු බව මම තරයේ විශ්වාස කරමි.

දුෂ්කරතා, වර්ධනයේ නව දොරටු විවර කරන බව කීම වැරදි නැත. ඔබට නව්‍ය අදහස් ඇති විට, කිසිදු අවස්ථාවක් මග හැරීම ගැන ඔබ කරදර විය යුතු නැත.

අනාගතය කුමක් වුවත්, ශක්තිමත් පදනමක් ගොඩනඟා ගැනීමටත්, වටිනාකම් සහිත නිර්මාණශීලී සංස්ථාවක් බවට පත්වීමේ අරමුණින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ වර්තමාන සීමාවෙන් ඔබ්බට ඉදිරියට යාමටත් මම උත්සාහ කරමි.



ඉහත සඳහන් කළ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ ඒවා ඉටු කර ගැනීමට අප වෙත නොමසුරුව සහය දුන් ගරු කර්මාන්ත අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමා, අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට ස්තූතිය පුදකිරිමට මම මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි.

පසුගිය මූල්‍ය වර්ෂය සඳහා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සහ කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි.

*අත්සන් කලේ*,
නිතිඥ ගාමිණි ඒකනායක,
සභාපති,
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

## ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුව

| | | |
|---|---|---|
| 01. එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක | ගණකාධිකාරී | ප්‍රධාන කාර්යාලය |
| 02. ඊ.එස්.චාන්දනී | පිරිස් නිලධාරී | ප්‍රධාන කාර්යාලය |

# ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව
# විගණන කමිටුවේ වාර්තාව - 2020

සංස්ථාවේ විගණන කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් සමන්විතවේ. කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකතුමා හා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතවරයෙකුද නිරීක්ෂකවරුන් ලෙස ඊට සහභාගි වේ.

2020 වර්ෂයේදී විගණන කමිටුවේ සභාපති ලෙස ඩබ්.ජී.ඩී.සී.ඩී.එස්.රාජකරුණා මහත්මිය කටයුතු කල අතර ජී.එල්.චමින්ද ජයලාල් මහතා සහ ඊ.ඒ.එස්.සුරංග මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු කරනු ලැබිණි.

මේ වන විට විගණන කමිටුවේ සභාපති ලෙස . ඩබ්.ආර්.පරණගම මහතා කටයුතු කරනු ලබයි. ජී.එල්.චමින්ද ජයලාල් මහතා සහ ඊ.ඒ.එස්.සුරංග මහතා කමිටුවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස තවදුරටත්කටයුතු කරනු ලැබිණි.

විගණන කමිටුවේ වගකීම් හා කාර්යභාරය පහත පරිදි වේ.

අ. වාර්ෂික වාර්තාවන්, ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා අනෙකුත් අදාල නීතිමය තත්වයන්ට අනුකූල වන ලෙස සකස්කර තිබේද යන්න පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දීම.

ආ. අදාල නීති, රෙගුලාසි සහ අනුමත චක්‍රලේඛයන්ට අනුකූලව සංස්ථාව කටයුතු කර තිබේද සහ එසේ අනුකූල නොවන අවස්ථාවන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට උපදෙස් ලබා දී දැනුවත් කිරීම.

ඇ. අභ්‍යන්තර සහ බාහිර විගණන වාර්තා සහ පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරකසභාවේ උපදෙස් සලකා බැලීම හා ඒ පිළිබඳ කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට උපකරෙ කිරීම.

ඈ. අභ්‍යන්තර පාලන ක්‍රමයන් සංස්ථාවට හඳුන්වා දීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කීරිම.

සමාලොචිත වර්ෂයේ විගණන කමිටුව විසින් වෙන්ත් කාර්යයන් සමග පහත සඳහන් ක්‍රියාකාරකම් වලද යෙදුනි.

- විගණනය නොවූ මාසික මූල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණනය වූ වර්ෂයට අදාල මුල්‍ය වාර්තා පරික්ෂා කිරීම.
- විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණක වාර්තා පරික්ෂා කිරීම හා කළමණාකරණය විසින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කීරිම.
- ව්‍යවස්ථාපිත ගෙවීම් පිළිබඳ දැනුවත් කීරිම.

***අත්සන් කලේ,***
**ඩබ්.ආර්.පරණගම,**
***සභාපති - විගණන කමිටුව***

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ටීසීඑම්/ඒ/එස්එල්සීසී/96/<br>2020/එෆ්ඒ | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2021 සැප්තැම්බර් 28 දින |

සභාපති

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. තත්ත්වාගණනයකළ මතය

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 32 ඡේදය ප්‍රකාරව මුදල් ලැබීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් සහිත අවුරුදු 3 ත් 10 ත් අතර කාල පරාසයක පවතින එකතු වටිනාකම රු.31,324,469 ක් වූ ණය ශේෂයන් 20 ක් සඳහා අඩමාන ණය වෙන්කිරීමක් සිදු කර නොතිබුණු අතර ණයගැතියන්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

කවුරුන්ද යන්න හඳුනාගත නොහැකි එකතු වටිනාකම රු.25,925,739 ක් වූ ණය ශේෂ 3 ක් ද එම වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත්වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 වගන්තිය ප්‍රකාරව දේපල පිරියත උපකරණ අයිතමයන්හි සාධාරණ වටිනාකම වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයක් අවශ්‍ය වුවත් සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් දැනට ධාවන තත්වයේ පවතින එකතු වටිනාකම රු. 4,463,964 ක් වූ වාහන 02 ක් ඓතිහාසික පිරිවැයට ගිණුම්වල දක්වා තිබුණු අතර ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂ වෙනම වර්ගීකරණය කොට මූල්‍ය ප්‍රකාශනවල දක්විය යුතු වුවද සංස්ථාව විසින් මුළු ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක කොටස් ආයෝජනය කර ඇති ලංකා සිමෙන්ති සමාගමෙන් අයකර ගත යුතු රු.1,940,555 ක ශේෂය වෙළඳ ණයගැති ශේෂය තුළ ඇතුළත් කොට තිබුණි. තවද එම ශේෂයට අදාල ගණුදෙනුවල ස්වභාවය සහ අනෙකුත් තොරතුරු හෙළිදරව්කර නොතිබුණි.

(ඈ ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 40 හි 5 ඡේදය ප්‍රකාරව ආයෝජන දේපලක් ලෙස හඳුනාගෙන ඇති රු.735,000,000 ක් වූ කොල්ලුපිටිය ඉඩම මූල්‍ය ප්‍රකාශන වල ආයෝජන දේපල යටතේ දැක්විය යුතු වුවද දේපල පිරියත උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඉ) සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.10 කොටස් 108,361,891 ක එනම් එකතුව රු.1,083,618,910 ක් ආයෝජනය කර තිබුණි. ඒ අනුව සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන ලංකා සිමෙන්ති සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක් සංස්ථාව සතු වුවද, සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

(ඊ) සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ තුළ ඇතුළත් වත්කම් වර්ග 3 කට අදාලව ගිණුම්ගත කර ඇති එකතු වටිනාකම රු. 9,645,006 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛණයට අනුව එම වත්කම් වල එකතු වටිනාකම රු. 6,046,932 ක් වීමෙන් රු. 3,598,074 ක වෙනසක් පැවතුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 139,865 ක් වූ ක්ෂය වියදම ගිණුම්ගත කිරීමේදී රු. 169,865 ක් ලෙස ගිණුම්ගත කිරීම මඟින් වර්ෂයේ ක්ෂය වියදම රු. 30,000 කින් වැඩියෙන්ද වර්ෂයේ ලාභය එම අගයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඍ) 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව සංස්ථාව පිහිටි කාර්යාල පරිශ්‍රය වෙනුවෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත ගෙවිය යුතු කුළිය රු.3,822,724 ක් ලෙස සටහන් වුවද ශේෂ සනාථ ලිපිය අනුව එදිනට නිරවුල් නොකළ මුදල රු1,052,462ක් වූයෙන්, රු.2,520,262 ක වෙනසක් විය.

(එ) සංස්ථාවට අයත් සිමෙන්ති තොගයක් කන්කසන්තුරේ සිමෙන්ති කම්හල වෙත භාර නොදීම මත සිදු වූ අලාභය ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් අංක 96842 M දරන නඩුව මගින් සංස්ථාව වෙත ලැබිය යුතු රු.436,140 ක මුදල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණ අතර, 2015 වර්ෂයේදී සංස්ථාව වෙත ගෙවා අවසන් කරන ලද අංක 90302 නඩුවට අදාළ රු.663,800 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ගිණුම් සටහන් අංක 1:5 යටතේ තවදුරටත් අසම්භාව්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි

(ඒ) ණයගැතියන් තිදෙනකු විසින් ලබාදුන් ශේෂ සනාථ සහතික අනුව රු.381,966 ක ශේෂයන් සංස්ථාවට අයවියයුතු බව දන්වා තිබුණද මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කර නොතිබුණ අතර ණයගැතියන් දෙදෙනකුට අදාලව රු. 2,831,142 ක ශේෂයක් ලැබියයුතු බව මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණද ශේෂ සනාථ සහතික අනුව එවැනි ශේෂයන් නොතිබුණි.

(ඔ) කන්කසන්තුරේ පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2 ක් හා නළ පද්ධති ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත බදු දීම වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු කුළී මුදල රු.168,000,000 ක් වුවද මූල්‍යප්‍රකාශන වල සටහන් අංක 1:5:1 යටතේ එය 2019 දෙසැම්බර් 01 දිනට අයවිය යුතු කුළී ලෙස රු. 151,320,000 ක් වශයෙන් රු. 16,680,000 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඕ) 2004 වර්ෂය සඳහා වන විගණන ගාස්තුව රු.188,258 ක් වුවද ඒ සඳහා එකඟතාවය එළ නොකිරීම නිසා ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබුණ අතර 1990 වර්ෂය සඳහා ගෙවිය යුතු රු 335,249 ක් වූ විගණන ගාස්තු වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින දක්වා ගෙවීමට හෝ ගෙවිය යුතු වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වෙන් කිරීම් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්වාගණනයකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූමගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරවමා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙසමා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරනලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාරතාවේ 1.2(අ),(ඒ),(ඊ),(ඌ,(ඕ),2.2.2(ආ) සහ 2.3(අ),(ආ),(ඇ),(ඈ),(ඉ),(ඊ) යන වගන්ති හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධවී යම් ගිවිසුමක්

සම්බන්ධයෙන් ඍජුව හෝ අනාාකාරයකින් සාමානාා ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව **පහත** සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | **නීති රීති/ විධානයට යොමුව** | **විස්තරය** |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4.2 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාළ නීති රීති ඇතුළත් කාර්ය පරිපාටි පිළිබඳ අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, සංස්ථාව විසින් ඊට අදාළ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) | 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරී සැලැස්ම තුළ අභ්‍යන්තර විගණන සැලැස්මක් ඇතුළත්කර නොතිබුණ අතර. 2016 වර්ෂයේ සිට සංස්ථාව තුළ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක නොවුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත්සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) අංක 96/1900/111/135 හා 1996 අගෝස්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මගින් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් අරුවක්කාලුහි හුණුගල් නිධිය පිහිටි අක්කර 5140 ක ඉඩම අවුරුදු 50 කාලයකට බදු දීම සඳහා පුත්තලම සිමෙන්ති සමාගම (දැනට සියැම් සිටි සිමෙන්ති (ලංකා) සමාගම) සමඟ 1993 දෙසැම්බර් 29 දින ගිවිසුම් අත්සන් කර තිබුණි. අදාල ගිවිසුමේ බදු කුලී වාර්ෂිකව වැඩිවීමට කොන්දේසි සලසා නොතිබුණ අතර රු 11,500,000 ක් වූ ස්ථාවර මුදලකට වාර්ෂික වාරිකය තීරණය කර තිබුණි. මේ හේතුවෙන් 1993 සිට 2018 වර්ෂය දක්වා සංස්ථාවට විශාල ආදායමක් අහිමිවී තිබුණි. ඒ අනුව 2019 නොවැම්බර් 07 දින අත්සන් කල 268 දරන අතිරේක ගිවිසුම මගින් බදුකුලිය වැඩිවීමේ ප්‍රතිශතය සියයට 12 ක් ලෙස සඳහන් කලද 1993 සිට 2018 දක්වා වූ කාලය සඳහා බදු කුලී වැඩිවීම පිළිබඳ එකඟතාවයකට පැමින නොතිබුණි. 2019 වර්ෂයේ සිට වාර්ෂික බදු කුලිය ඇ.ඩො. 319,118 ක් වශයෙන් ගිවිසුම අත්සන් කලද එම අතිරේක බදු ගිවිසුම සඳහා නීතිපති වරයාගේ අනුමැතිය මෙම වාර්තාවේ දින වන විටත් ලබාදී නොතිබුණි.

(ආ) 1967 ජූලි 12 දිනැති අංක 14, 756/7 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව සංස්ථාව සතු පර්චස් 89.7 ක් වූ කොල්ලුපිටිය පිහිටි ඉඩම 2017 වර්ෂයේ රු.735,000,000 කට තක්සේරු කර තිබුණි.මෙම ඉඩම සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් යොදාගෙන ඉහළ ආදායමක් උපයා ගැනීම සංස්ථාවේ ප්‍රධාන අරමුණක් වූවද ඊට පරිබාහිරව මෙම භූමිය වාහන ගාල් කිරීම සඳහා බාහිර ආයතන වලට ලබාදී තිබුණි.මේ සඳහා ආයතන තෝරා ගැනීමේදී 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 ඡේදයට පරිබාහිරව ටෙන්ඩර් කැඳවීමකින් තොරව විවධ ආයතන 7 කට ලබාදී තිබුණි. මෙම ආයතන සමඟ ලිඛිත ගිවිසුම් වලට හෝ සංස්ථාව එළඹ නොතිබුණි. 2017 වර්ෂයේදී මෙම ඉඩම රජයේ බැංකුවක් වෙත උකස්කොට ලබාගෙන තිබූ රු. 97,700,000 ක ණය මුදලින් 2020 දෙසැම්බර් මස 31 වන විට තව දුරටත් ගෙවීමට ඇතිණය මුදල රු. 67,700,000 ක් වූ අතර මේ දක්වා ගෙවා ඇති මුළුපොලිය රු.47,870,613 ක් වී තිබුණි. 2020 වර්ෂය වෙනුවෙන් ගෙවූ වාර්ෂික පොළිය 7,452,517 ක් වූවද, වාහන ගාල් කිරීමෙන් වර්ෂයේ ලද කුලීආදායම රු 4,424,070 ක් පමණක් වන බැවින් ඉතාමත් ඉහළ වාණිජ වටිනාකමක් ඇති ප්‍රදේශයක පිහිටි මෙවැනි දේපලක් ඵලදායී ආයෝජනයක් සඳහා යොදාගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි

(ඈ) 1994 දෙසැම්බර් මස 06 දින සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ කොටස් වලින්, කොටස් 108,361,891 ක්, කොටසක් රු. 10 ක නාමික අගය මත මිලදී ගෙන සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 62.45 ක හිමිකාරීත්වයක් දැරුවද කොටස් මිලදී ගත් 1994 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා ආයෝජනය වෙනුවෙන් කිසිදු ප්‍රතිලාභයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ඈ) මහවැලි මෙරින් සිමෙන්ති සමාගමේ රුපියල් 10 සමාන්‍ය කොටස් 480,000 ක රු.6,400,000 ක්වූ ආයෝජනය වෙනුවෙන් 2014 වර්ෂයෙන් පසු කිසිදු ලාභාංශයක් සංස්ථාව වෙත ලැබී නොතිබුණි.

(ඉ) කන්කසන්තුරේ පිහිටි සංස්ථාවට අයත් තෙල් ටැංකි 2 ක් හා නළ පද්ධති ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 22 දිනැති තක්සේරු වාර්තාව මත පදනම්ව 2010 වර්ෂයේ සිට 2020 දක්වා රු. 168,000,000 ක මුදල් සංස්ථාව වෙත ගෙවිය යුතු බවට තක්සේරු කර තිබුණි. බදුකුළී අයකර ගැනීම සඳහා HO/1/5 – 2020 ජනවාරි 24 සහ HO/1/5 – 2020 ජුනි 30 දිනැති ලිපි මඟින් සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශය දැනුවත් කළ ද විගණිත දින වන විටත් එම මුදල් අයවී නොතිබුණි.

(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු.1,200,000 ක් ලෙස ගිණුම්ගත කර තිබූ ගාල්ල උණවටුන කැස්බෑපාන ඉඩම හබරාදූව ප්‍රදේශීය ලේකම් විසින් සුනාමියෙන් හානි වූ නිවාස නැවත ඉදි කිරීම සඳහා අත්පත් කරගෙන තිබුණි. මෙම ඉඩම ප්‍රාදේශීය ලේකම් වෙත අයිතිය පවරාගෙන පදිංචිකරුවන් වෙත ඔප්පු ලබාදීමට හා සංස්ථාවට වන්දි ලබාදීම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් නඩුවක් ගොනු කර ඇතත් කිසිදු වන්දි මුදලක් ලබා ගැනීමට මේ දක්වා සංස්ථාවට නොහැකි වී තිබුණි..

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

මූල්‍ය තත්ව ප්‍රකාශනය
**2020 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | **03** | 797,608,301 | 797,731,556 |
| විකිණීම සඳහා වූ වත්කම් | **04** | 750,000 | 750,000 |
| දිගුකාලීනව ලැබිය යුතු වත්කම් | **05** | - | - |
| ආයෝජන | **06** | 631,071,607 | 630,769,134 |
| | | **1,429,429,908** | **1,429,250,690** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | **07** | 238,256 | 238,256 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | **08** | 74,017,285 | 76,862,633 |
| මුදල් හා මුදල් සමාන දෑ | **09** | 63,521,348 | 26,944,605 |
| | | **137,776,889** | **104,045,494** |
| **මුළු වත්කම්** | | **1,567,206,797** | **1,533,296,184** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 966,971,845 | 966,971,845 |
| පොදු සංචිතය | | 9,996,952 | 9,996,952 |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 738,702,984 | 561,202,984 |
| රඳවාගත් ඉපැයුම් | | (276,879,869) | (138,864,838) |
| විකිණීම සඳහා වූ වත්කම් වලට අදාළ සංචිත | | (465,956,132) | (465,956,132) |
| **ශ්‍රි.ල.සි.ස. හිමිකම් දරන්නන්ට අදාළ සංචිත** | | **972,835,780** | **933,350,811** |
| සුළු කොටස් හිමිකාරීත්වය | | - | - |
| **මුළු හිමිකම්** | | **972,835,780** | **933,350,811** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පොළී ගෙවිය යුතු දිගුකාලීන වගකීම් | **11** | 58,700000 | 67,700,000 |
| දිගුකාලීන වගකීම් | **13** | 492,426,190 | 492,426,190 |
| විශ්‍රාම පාරිතෝෂිත අරමුදල | **14** | 5,519,302 | 4,674,578 |
| | | **556,645,492** | **564,800,768** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | **15** | 28,274,104 | 28,433,713 |
| කෙටිකාලීනව පොළී ගෙවිය යුතු වගකීම් | **11** | 9,000,000 | 6,000,000 |
| උපචිත බැංකු ණය පොළී | **12** | 451,421 | 710,892 |
| | | **37,725,525** | **35,144,605** |
| **මුළු වගකීම්** | | **594,371,017** | **599,945,373** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,567,206,797** | **1,533,296,184** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

*අත්සන් කලේ,*

**එම්.ජී.ඒ.ටී.ආර්.ජයතිලක - ගණකාධිකාරී**

මෙම මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා වන වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. මූල්‍ය ප්‍රකාශන අනුමත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

**අත්සන් කලේ,**
**ගාමිණි ඒකනායක - සභාපති**

**අත්සන් කලේ,**
**ටී.ඒ.ජ්ස.ඒස්.ඩී.සිල්වා - අධ්‍යක්ෂ**

**අත්සන් කලේ,**
**ජී.එල්.චමින්ද ජයලාල් - අධ්‍යක්ෂ**

**2021 මාර්තු 29 වන දින**

**විස්තීරණ ආදායම් හා රඳවා ගත් ඉපැයුම් ප්‍රකාශනය**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| ආදායම් | **16** | 62,305,693 | 63,306,817 |
| විකුණුම් පිරිවැය | **Sta. I** | - | (565,129) |
| **දළ ලාභය/ (අලාභය)** | | **62,305,693** | **62,741,688** |
| වෙනත් ආසායම් | **17** | 4,730,156 | 7,045,189 |
| බෙදාහැරීම් වියදම් | **Sta. II** | - | - |
| පරිපාලන වියදම් | **Sta. III** | (18,861,766) | (18,897,716) |
| මූල්‍ය වියදම් | **18** | (7,455,517) | (11,539,256) |
| **බදු පෙර ලාභය/ (අලාභය)** | **19** | **40,718,566** | **39,349,905** |
| බදු පිරිවැය | | (1,302,335) | - |
| **වර්ෂයට අදාළ ලාභය** | | **39,416,231** | **39,349,905** |
| වෙනත් විස්තීරණ ආදායම් / (වියදම්) | | - | - |
| මුළු විස්තීරණ ආදායම් / (වියදම්) | | **39,416,231** | **39,349,905** |
| වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම් හා විකිණීම සඳහා වූ සංචිත | | (604,820,972) | (647,854,934) |
| පෙර වර්ෂය සඳහා වූ ගැලපුම් | **20** | (177,431,260) | 3,684,059 |
| වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම් හා විකිණීම සඳහා වූ සංචිත | | **(742,836,001)** | **(604,820,970)** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

**ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | **2019.01.01** දිනට | **2019** වර්ෂය | පෙර වර්ෂය සඳහා වූ ගැලපීම් | **2019.12.31** දිනට |
|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 966,971,845 | - | - | 966,971,845 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 561,202,984 | - | - | 561,202,984 |
| පොදු සංචිතය | 9,996,952 | - | - | 9,996,952 |
| රඳවා ගත් ඉපැයුම් | (181,898,802) | 39,349,905 | 3,684,905 | 9138,864,838) |
| විකිණීම සඳහා වූ වත්කම් වලට අදාළ සංචිත (ඒල්.සී.ඒල්.හි කොටස් ආයෝජනයේ අලාභ) | (465,956,132) | - | - | (465,956,132) |
| **මුළු හිමිකම්** | **890,316,847** | **39,349,905** | **3,684,059** | **933,350,811** |

| | **2019.12.31** දිනට | **2020** වර්ෂය | පෙර වර්ෂය සඳහා වූ ගැලපීම් | **2020.12.31** දිනට |
|---|---|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 966,971,845 | - | - | 966,971,845 |
| ප්‍රත්‍යාගණන සංචිතය | 561,202,984 | - | 177,500,000 | 738,702,984 |
| පොදු සංචිතය | 9,996,952 | - | - | 9,996,952 |
| රඳවා ගත් ඉපැයුම් | (138,864,838) | 39,416,231 | (177,431,260) | (276,879,869) |
| විකිණීම සඳහා වූ වත්කම් වලට අදාළ සංචිත (ඒල්.සී.ඒල්.හි කොටස් ආයෝජනයේ අලාභ) | (465,956,132) | - | - | (465,956,132) |
| **මුළු හිමිකම්** | **933,350,811** | **39,416,231** | **68,740** | **972,835,780** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | | 2020<br>රු. | | 2019<br>රු. |
|---|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | | |
| බදු පෙර ලාභය (අලාභය) | | 40,718,566 | | 39,349,905 |
| **මුදල්මය නොවූ ආදායම් /(වියදම්) ගැලපීම** | | | | |
| ක්ෂය | 169,865 | | 97,040 | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 844,724 | | 661,740 | |
| බැංකු ණය පොළී | 7,452,517 | | 11,539,256 | |
| මුදල්මය නොවන පෙර වර්ෂ ගැලපීම් | 584,030 | | 3,763,396 | |
| තැම්පතු මත ලද පොළී | (4,192,841) | | (2,680,534) | |
| භාණ්ඩාගාර බිල්පත් පොළී | (423,924) | 4,434,371 | (543,079) | 12,837,819 |
| | | **45,152,937** | | **52,187,724** |
| **මෙහෙයුම් වත්කම් හා වගකීම්වල වූ වෙනස්කම්** | | | | |
| තොගයේ සිදු වූ අඩුවීම් / (වැඩිවීම්) | | - | | 687,230 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම්වල සිදු වූ අඩුවීම් / (වැඩිවීම්) | | 1,543,013 | | (3,863,413) |
| උපචිත බැංකු ණය පොළී වැඩිවීම් / (අඩුවීම්) | | (259,471) | | - |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දැනි සිදු වූ වැඩිවීම් / (අඩුවීම්) | | (159,609) | | (8,390,279) |
| | | **46,276,870** | | **40,621,262** |
| **අඩුකිරීම් :** | | | | |
| පාරිතෝෂිත ගෙවීම් | - | | - | |
| පොළී ගෙවීම් | (7,761,054) | | (12,053,870) | |
| බදු ගෙවීම් | - | (7,761,054) | (2,595,701) | XXXXX |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **38,515,816** | | **25,971,691** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | | |
| කෙටිකාලීන තැම්පතුවල ආයෝජනයන් | | (51,500,000) | | (46,700,000) |
| තැම්පතු හා පොළී මුදල් කර ගැනීම් | | 18,503,582 | | 48,510,055 |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (46,610) | | (171,300) |
| භාණ්ඩාගාර බිල්පත් පොළී මුදල් කරගැනීම් | | 423,924 | | 1,921,174 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(33,043,028)** | | **1,638,755** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | | |
| බැංකු ණය නැවත ගෙවීම් කිරීම | | (6,000,000) | | (24,000,000) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(6,000,000)** | | **(24,000,000)** |
| **මුදල් හා මුදල් සමාන දෑහි වැඩිවීම/(අඩුවීම)** | | **(527,212)** | | **3,610,446** |
| වර්ෂ ආරම්භක බැංකුවේ වූ මුදල් | | 6,680,801 | | 3,070,355 |
| වර්ෂ අවසාන බැංකුවේ වූ මුදල් | | **6,153,589** | | **6,680,801** |
| ඒකතුකලා : කෙටිකාලීන තැම්පතු | | 57,367,759 | | 20,263,804 |
| **වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑහි ශේෂය** | | **63,521,348** | | **26,944,605** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි පිටු අංක 28 සිට 34 දක්වා ගණකාධිකරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 35 සිට 38 දක්වා සටහන් ඇතුලත් වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

**1.සාමාන්‍ය තොරතුරු**

කන්කසන්තුරේ පිහිටි සිමෙන්ති කර්මාන්තශාලාව වර්ෂ 1945 ජූලි මස 29 වන දින ස්ථාපිත කරන ලද අතර ඒහි නම "කන්කසන්තුරේ සිමෙන්ති කම්හල" නම් විය.

මෙම සිමෙන්ති කර්මාන්තශාලාව 1955 අංක 19 දරණ රාජ්‍ය අනුග්‍රහයලත් සංස්ථා පනතේ විධිවිධාන යටතේ 1956 වර්ෂයේ රාජ්‍ය සංස්ථාවක් බවට පරිවර්තනය කරන ලදුව කන්කසන්තුරේ සිමෙන්ති කම්හල නමින් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. ඉන්පසුව 1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1959 ජනවාරි 01දා සිට ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය නමින් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. 1980 වර්ෂයේදී අතිවිශේෂ ගැසට්පත්‍රයේ නිවේදනයට අනුව මෙහි නම "ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව" ලෙස සංශෝධනය කරන ලදි.
මෙහි ප්‍රධාන කාර්යාලය අංක 130, ඩබ්.ඒ.ඩී.රාමනායක මාවත, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා තිබූ අතර ඒය අංක 27, වොක්ෂෝල් මන්දිරය, වොක්ෂෝල් වීදිය, ොකාළඹ 02 යන ස්ථානයේ 2015 ජූලි මස සිට ස්ථාපිත කර ඇත.

ලංකා සිමෙන්ති සමාගමේ ආසන්න හා අවසාන හිමිකාරීත්වය දරනුයේ ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව වේ.

**2.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත සඳහන් වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනසක් සිදු කල බව සඳහන් වේනම් මිස මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වර්ෂය පුරාම ඒකාකාරිව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පාදක කරගෙන ඇත.

**2.1.මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ පදනම**

2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා සංස්ථාව විසින් පිළියෙළ කර ඉදිරිපත් කර තිබෙන මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීරණ ආදායම් හා රඳවා ගත් ඉපැයුම් සඳහා වූ ප්‍රකාශය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඇතුළු ගිනුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත පදනම් කර ගනිමිනි.
මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී සාධාරණ අගය මත අගයකල වත්කම් හා වගකීම් හැරඅනෙකුත් අයිත්තමයන් ඓතිහාසික පිරිවැය පදනම් කරගනිමින් සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සමහර විවේචනාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල වන පරිදි සිදු කර ඇත.

**2.2 සකස් කිරීමේ පදනම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශනවල ප්‍රකාශිත වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිත වන අතර සියලුම මූල්‍ය තොරතුරු ඒවායේ ආසන්න රුපියලට වටයා ඇත.

**2.2.1.දිගුකාලීන පැවැත්ම**

ආයතනයේ අධ්‍යක්ෂවරුන් විසින් ආයතනයේ දිගුකාලීන පැවැත්ම පිළිබඳ අධ්‍යනයක් සිදු කර දිගුකාලීන පැවැත්මට ඇති හැකියාව පිළිබඳ සොයා බැලිය යුතු අතර ආයතනය ඇවර කිරීමක් හෝ අහෝසි කිරීමක් සිදු කිරීමට අදහස් නොකල යුතුවේ.

**2.3.ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්**

**2.3.1.පරිපාලිතයන්**

1981 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ලංකා සිමෙන්ති සමාගමේ රු.1,083,618,910/-ක් ආයෝජනය කල අතර එහි 62.45%ක කොටස් හිමිකාරීත්වයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට හිමිය. එහි සම මිල රු.10/-කි. මෙම ආයෝජනයට මේ වන තුරු ප්‍රතිලාභ ලැබී නොමැත.

2017 වර්ෂයේදී මෙහි කොටසක වෙළඳපොළ අගය රු.5.70ක් වූ අතර මෙවන විට කොටස් හුවමාරු සිදු නොවන බැවින් කොළඹ කොටස් හුවමාරුවේහි ඒහි වටිනාකමක් ප්‍රකාශ නොකෙරේ.

කර්මාන්ත හා සැපයුම් දාම කළමනාකරණ අමාත්‍යාංශයේ මැදිහත් වීම මත මෙම සමාගම ඈවර කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

**2.3.2.ආශ්‍රිතයන්**

ලෆාජ් මහවැලි සිමෙන්ති (පෞද්ගලික) සමාගමේ සාමාන්‍ය කොටස් 320,000ක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වූ අතර 1995.12.31 දින ඊට අදාළව සාමාන්‍ය කොටස් දෙකක් සඳහා ඒක් ප්‍රසාද කොටසක් නිකුත් කරන ලදි. වර්තමානය වන විට ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව ඒහි සාමාන්‍ය කොටස් 480,000ක හිමිකාරීත්වය දරනු ලබයි. ඒය සාමාන්‍ය කොටස් හිමිකාරීත්වෙය් ප්‍රතිශතයක් ලෙස 10%කි.

2016 සැප්තැම්බර් 15 වන දින මෙම සමාගමේ නම මහවැලි මෙරීන් සිමෙන්ති (පෞද්ගලික) සමාගම ලෙස වෙනස් කර ඇත.

ආශ්‍රිතයන්හි කරන ලද ආයෝජනයන්, විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම් යටතේ ඉදිරිපත් කර ඇත. විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්වලට අදාලව හඳුනාගනු ලබන හානි කරන අලාභයන් , හිමිකම් යටෙත් ප්‍රකාශිත සාධාරණ අගය මත ඒකතුවී තිබෙන වෙන්කිරීම් හා ලාභඅලාභ ගිණුමට හඳුනාගනු ලැබේ.

ආශ්‍රිතයන්හි කරන ලද මෙම ආයෝජනයන් සඳහා ලාභාංශ ලැබීමක් ඒය ලැබීමට අයිතිය සංස්ථාවට ලද විට හඳුනාගැනීම සිදු කරන අතර ඒය වෙනත් ආදායම් යටතට නිරූපණය කරනු ලැබේ.

**2.3.3 සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ වූ ගනුදෙනු**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - එල්.කේ.ඒ.එස්. 24 (සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම්) වලට අනුව, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් (කේ.එම්.පී.) යනු ආයතනයේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීමේ අධිකාරිය සහ වගකීම දරන අයයි.ඉහත නිර්වචනයට අනුව, ඉහත දැක්වූ නිර්වචනයේ සඳහන් ක්‍රියාකාරකම් තුනම සිදු කිරීමේ අධිකාරිය සහ වගකීම යන දෙකම නොමැති නම් පුද්ගලයෙකු කේ.එම්.පී. ලෙස සැලකිය නොහැකිය.

**2.4.අයභාරය හඳුනාගැනීම**

සිමෙන්ති මළු මිලදී ගැනීම සහ විකිණීම හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදනයන් නිෂ්පාදනය කිරීම සහ විකිණීම යන ක්‍රියාකාරකම් තුලින් වූ ආදායම් හඳුනාගෙන සහ ඊට අදාල වියදම් , එහි ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුලට ගලා ඒමේ සම්භාවිතාවය සැලකිල්ලට ගනිමින් විශ්වාසවන්ත පදනමක් මත කාලපරිච්ජේදයට අදාල ප්‍රමාණය මිනුම් කර වාර්තා කිරීමේ කාලය අවසානයේදී හඳුනාගනු ලැබේ. ආදායම මනිනු ලබන්නේ ලැබුණු හෝ ලැබිය යුතු වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු වල සාධාරණ වටිනාකමෙනි. ආදායම හඳුනා ගැනීම සඳහා පහත සඳහන් නිශ්චිත නිර්ණායක භාවිතා කෙරේ.

**2.4.1. භාණ්ඩ විකිණීම**

කාලපරිච්ඡේදයට අදාල භාණ්ඩ විකිණීම් ආදායම හඳුනාගනු ලබනුයේ විකුණූ භාණ්ඩවල අවධානම හා එවායේ අයිතිය ගැනුම්කරු වෙත පැවරීමෙන් පසුව වේ.

**2.4.2. පොලී**

කාල අනුපාතය පදනම් කර ගනිමින් මෙම පොලී ආදායම් හඳුනාගනු ලබනුයේ වත්කම්වලට අදාල සඵල පොලී අනුපාතය සැලකිල්ලට ගනිමිනි.

**2.4.3. වෙනත්**

උපචිත පදනම මත වෙනත් ආදායම් හඳුනා ගනු ලැබේ.

**2.5. ණය පිරිවැය**

යම් කාලපරිච්ඡේදයක් තුල දරණ ලද ණය සඳහා වූ පිරිවැය එම කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

**2.6. ආදායම් බදු**

ආදායම් බදු පිරිවැය නියෝජනය කරන්නේ දැනට ගෙවිය යුතු බද්දේ එකතුවයි.
දැනට ගෙවිය යුතු බද්ද වර්ෂය සඳහා බදු අය කළ හැකි ලාභය මත පදනම් වේ.

**2.7.දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ වල වටිනාකම මනිනු ලබනුයේ ඒවායේ පිරිවැයෙන් ඊට අදාල සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙනි.
ක්ෂය වීම් ගණනය කිරීමේදී සෘජු ක්‍රමය භාවිතා කරන අතර එහිදී අදාල වත්කමේ පිරිවැයෙන් එහි අවශේෂ පිරිවැය අඩුකර එම වටිනාකම වත්කමේ ඵලදායී ජීව කාලය පුරා ඇස්තමේන්තු කිරීමෙනි.
ක්ෂය ගණනයේදී පහත දැක්වෙන වාර්ෂික ක්ෂය අනුපාත පදනම් කර ගනු ලැබේ.

| **විස්තරය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 6.67% |
| යන්ත්‍ර සූත්‍ර | 12.5% |
| පස් ප්‍රවාහන යන්ත්‍ර හා බර යන්ත්‍රෝපකරණ | 25.0% |
| මොටර් රථ වාහන | 25.0% |
| මෙවලම් හා උපකරණ | 25.0% |
| ලී බඩු හා සවිකිරීම් | 25.0% |
| රේල් පීලි | 10.0% |

වත්කමට අදාල ක්ෂය අනුපාතයන්හි ඵලදායී ජීව කාලයෙහි හෝ අවශේෂ පිරිවැයෙහි සැලකිය යුතු වෙනසක් සිදු වේ නම් එම වත්කම ක්ෂය කිරීම අතීත කාලයට බලපාන පරිදි ගැලපීම් කරනු ලැබේ.

රු.10,000/-ට අඩු වටිනාකමක් සහිත දේපල පිරියත උපකරණ ප්‍රාග්ධනිත නොකිරීම හා එය මිලදී ගනු ලැබූ වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම ආයතනයේ ප්‍රතිපත්තිය වේ.

**2.8. වත්කම් ගවේශණය කිරීම සහ ඇගයීම**

ශ්‍රී ලංකා ජනරජය විසින් 1977 සැප්තැම්බර් මස 20 වන දින නිකුත් කරන ලද අංක: 283/2 දරණ ගැසට් පත්‍රය මඟින් අක්කර 5,164 රූඩ් 0 පර්චස් 25කින් යුත් ඛණිජ නිධියක් සහිත ඉඩම ලංකා සිමෙන්ති සංස්ථාවට පවරා ඇත.
මෙම සම්පූර්ණ ඉඩම වසර 50ක කාලයකට 1993වසරේදී පුත්තලම සිමෙන්ති (පෞද්ගලික) සමාගමට සිමෙන්ති නිෂ්පාදනය සඳහා අවශ්‍ය හුණුගල් කැණීම් කිරීම සඳහා බදු ගිවිසුමක් යටතේ බදු දී ඇති අතර ඒහි නාමය හොලිසීම් ලංකා (පෞද්ගලික) සමාගම ලෙස වෙනස් කල අතර වර්තමානය වන විට සියාම් සිටි සිමෙන්ති ලංකා (පෞද්ගලික) සමාගම ලෙස භාවිතා කරනු ලැබේ.
මෙම ඉඩමේ වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති අතර එය ලද විගස ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.9.විකිණීම සඳහා වූ වත්කම්**

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව යුද්ධය පැවති කාලයට පෙර මෙහෙයුම් කටයුතු සඳහා මෙම දුම්රිය මෙහෙයුම් මැදිරි භාවිතා කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක - එල්.කේ.ඒ.එස්. 16 හි වූ ප්‍රතිපාදනයන්ට අනුව වලට අනුව, සාධාරණ අගය මත පදනම්ව ඒහි වටිනාකම හඳුනාගෙන තිබෙන අතර ජංගම නොවන වත්කම් යටතේ වූ විකිණීම සඳහා තබා ඇති වත්කම් පංතිය වෙත මෙය මාරු කර ඇත. මෙම වත්කමට අදාළ සාධාරණ අගයෙහි වැඩිවීමක් සිදු වූ විටදී, ඒම වත්කමට අදාළව මීට පෙර හඳුනාගෙන තිබෙන හානිකරණ අලාභ වෙන්කිරීම් ගිණුමට හා ලාභඅලාභ ගිණුමට හඳුනාගනු ලබන අතර ඉතිරියක් වේනම් ඒය වෙනත් විස්තීරණ ආදායම් යටතට හා හිමිකම් යටතේ වූ ප්‍රත්‍යාගණන සංචිතයට හඳුනාගනු ලැබේ.

**2.10. තොගය**

තොගයෙහි වටිනාකම ලෙස ගිණුම්ගත කරනුයේ එහි පිරිවැය හෝ විකුණුම් අගයෙන් විකුණුම් හා සම්බන්ධ පිරිවැයන් අඩුකල පසු ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය වේ.
එනම් තොග සහ කෙරෙමින් පවතින වැඩ, ගත්මිල අනුව හෝ ශුද්ධ උපලබ්ධි අගයට තක්සේරු කිරීමෙනි.
පිරිවැය ගණනයේදී ප්‍රථමයෙන් ලද තොග ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමය සැලකිල්ලට ගනු ලැබේ.

**2.10.1. කන්කසන්තුරේ තිබෙන කැණීම් කරන ලද හුණුගල්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පලාලී ගුවන් ධාවනපථය සකස් කිරීමේදී කැණීම් කර ඉතිරි වී තිබූ හුණුගල් සංස්ථාවට භාරදී ඇත. ඒහි ඇගයීම කටයුතු සිදු ෙවමින් පවතී. ඒහි ප්‍රමාණ හයක පමණ ඒකතුවක් පවතින අතර මුළු තොගය ඝනමීටර 25,750කි. මෙය තක්සේරු මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ෙනාමැත.

**2.11. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

ණය පදනම යටතේ මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් ඇති වන මෙම වගකීම් පොලී අය කිරීමකින් තොර වේ. විදේශීය ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු වටිනාකම් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්ථනය කර ගිණුම්ගත කරන ඇතර ඉන් ඇති වන විදේශීය මුදල් හුවමාරු ලාභ / (අලාභ) වේ නම් එය වෙනත් ආදායම් යටතේ නිරූපණය කරනු ලැබේ.

**2.11.බැංකු ණය හා අයිරා පහසුකම්**

බැංකු ණය හා අයිරා පහසුකම් සඳහා වන පොලී ගණනයේදී සඵල පොලී අනුපාතයන් පදනම් කර ගනු ලබන අතර එය මූල්‍ය වියදම් යටතේ නිරූපණය කරනු ලැබේ.

**2.12.වෙන්කිරීම්, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්**

මූල්‍ය තත්ව ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන දිනට යම් කරුණක් සම්බන්ධව වගකීමක් ඇතිවේනම් හෝ ඊට අදාළව සම්පත් ගලායාමට සම්භාවිතාවයක් තිබේනම් හා එම සම්පත් ගලායෑම ඇස්තමේන්තු කල හැකි නම් ඊට අදාළව වෙන්කිරීම් සිදු කල යුතු වේ.

ආයතනයේ සම්පත් ගලායෑමේ ප්‍රවණතාවයක් නොමැති වුවද සියලුම අසම්භාව්‍ය වගකීම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.

ආයතනය තුලට සම්පත් ගලාඒමේ ප්‍රවණතාවයක් වේනම් පමණක් අසම්භාව්‍ය වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුල සටහනක් මගින් හෙළිදරව් කල යුතු වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් වෙළඳ ලැබිය යුතු වටිනාකම් වෙනුවෙන් අධිකරණයේ නඩු දහතුනක් (13) ගොනු කර ඇත.

| නඩු අංකය | ගොනු කරන ලද වර්ෂය | වගකිවයුතු පාර්ශවය | හිමිකම (රු.) |
|---|---|---|---|
| වෙළඳ | | | |
| 47146/ඒම්ආර් | 2003 | යූ.ඒන්.අබේසේකර | 679,500.00 |
| 56783/ ඒම්ආර් | 2003 | ආර්.ඒම්.පී.ඩී.ඒම්.රාජපක්ෂ | 1,656,000.00 |
| 47175/ ඒම්ආර් | 2003 | කේ.ඒ.ජේ.ජයන්ත පෙරේරා | 110,500.00 |
| 000262/08 | 2003 | නිව් අයිලන්ඩ් හාර්ඩ්වෙයාර් | 198,000.00 |
| 56780/ ඒම්ආර් | 2003 | වින්සර බෙදාහරින්නන් | 195,400.00 |
| 56781/ ඒම්ආර් | 2003 | ප්‍රසන්න කන්ස්ට්‍රක්ෂන්ස් | 92,250.00 |
| 000260/08 | 2003 | මයන්ත ට්‍රේඩර්ස් | 65,508.00 |
| 56782/ ඒම්ආර් | 2003 | ආර්.ඒ.ඒස්.කේ.රාජපක්ෂ | 810,683.60 |
| අයිආර් 324/03/11 | 2011 | ලේකා පෙරේරා | 1,112,000.00 |
| 90302 | 2012 | ඒ.ඒ.ඒ.මවුලානා | 663,800.00 |
| සීඅයිඩී | 2003 | පී.ඒම්.කේ.සෙනවිරත්න | 6,000.00 |
| සීඅයිඩී | 2003 | අයි.ඩී.ටී.චන්ද්‍රසිරි | 5,000.00 |
| සීඅයිඩී | 2015 | ආර්.සී.සී.ට්‍රේඩින් | 6,655,795.00 |
| වෙනත් | | | |
| 13365 – වාහන | 2013 | බී.ඒම්.සුගතදාස | |
| BR 232 – ඉඩම් | 2012 | පුත්තලම ඉඩම්හි අනවසර පදිංචිකරුවන් | |
| B/312/පීසී/2014 | 2014 | යාපනය, රජෙය් දේපළ වංචාව | |

2.13.1. තෙල් ටැංකි සංකීර්ණය සඳහා ලැබිය යුතු බදු කුලී

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් ඉදිකර භාවිතා කරන ලද ටැංකි 5 කින් යුත් තෙල් ටැංකි සංකීර්ණය 1990 ට පෙර මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන ලදි. යුද සමයේ සිට සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම සිය මෙහෙයුම් කටයුතු සඳහා මෙම තෙල් ටැංකි සංකීර්ණය භාවිතා කරනු ලැබේ. මෙම ටැංකි සඳහා කුලී ගෙවීම සම්බන්ධව අදාළ පාර්ශවයන් සමඟ පැවති සාකච්ඡාවලදී, 2010 සිට කුලී ගෙවීමට තීරණයක් ගත් අතර මෙම ටැංකි සඳහා කුලී වශයෙන් කිසිදු මුදලක් ගෙවා නොමැත. 2019 දෙසැම්බර් 31 දින වන විට එම සමාගමෙන් ලැබිය යුතු මුදල රු.151,320,000/- ක් වූ නමුත් එම පාර්ශවයන් සමඟ තවමත් කිසිදු ගිවිසුමකට එළඹ නැත.

**2.14. සේවක ප්‍රතිලාභ**

**2.14.1. අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්**
අර්ථ දැක්වූ ප්‍රතිලාභ සඳහා වන වගකීමෙ අදාළව වාර්තා කරන දිනයේ දී වූ වර්තමාන වටිනාකම මූල්‍ය තත්ව ප්‍රකාශය තුල හඳුනාගතයුතු වන බව පිළිගනී.

සංස්ථාවේ සේවකයින්ට අදාළ ප්‍රතිපාදන සැලසෙන්නේ ඔවුන්ගේ වැටුප්, දීමනා සහ වාර්තාකරන දිනය දක්වා වූ සේවා කාලය පදනම් කරගෙන ය. සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් වගකීම් ගණනය කිරීමේදී පැන නගින යම් යම් ලාභ හෝ අලාභ වෙනම් ඒය වෙනත් විස්තීරණ ආදායම් හෝ වියදම් යටතේ හඳුනාගනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම සිදු කරනුයේ සංස්ථාව තුළ වසර 5 කට අඩු අඛණ්ඩ සේවා කාලයක් ඇති සියලුම සේවකයින් ඇතුළුවය.

කෙසේ වෙතත්, පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ, සේවකයෙකුට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිත සඳහා ඇති වගකීම පැන නැඟෙන්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය අවසන් වූ පසුව පමණි. සේවකයින්ට විශ්‍රාම පාරිතෝෂිත ගෙවීම් සපුරාලීම සඳහා භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනයක් ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව විසින් සිදු කර ඇත.

**2.14.2.සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල**
සියලුම සේවකයින්ගේ සේවක අර්ථසාධක සඳහා පදනම් වන වැටුප මත සංස්ථාවේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ලෙස 10% ක් ද, සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය ලෙස 12% ක් ද, සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වය ලෙස 3% ක් ද දායක වේ.

**2.14.3.වෛද්‍ය පහසුකම් සඳහා වූ යෝජනා ක්‍රමය**
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද අනුමත සීමාවන් තුළ ප්‍රතිලාභයක් වශයෙන් සංස්ථාව විසින් සේවකයින් සඳහා වෛද්‍ය බිල්පත් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කෙරේ. මෙම යෝජනා ක්‍රමය සඳහා වූ දායක මුදලක් සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කෙරේ.



**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| **03. දේපළ, පිරියත හා උපකරණ**<br>**පිරිවැය** | **2020.01.01**<br>**දිනට** | **වර්ෂය තුල වූ**<br>**ඒකතු කිරීම්** | **වර්ෂය තුල වූ**<br>**අඩුකිරීම්** | **2020.12. 31**<br>**දිනට** |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| ඉඩම් සහ ගොඩනැගිලි | 797,795,981 | - | - | 797,795,981 |
| මෝටර් වාහන | 4,562,891 | - | - | 4,562,891 |
| ලීබඩු, උපකරණ හා සවිකිරීම් | 4,746,875 | 32,400 | - | 4,779,275 |
| මේවලම් හා උපකරණ | 288,630 | 14,210 | - | 302,840 |
| | 807,394,377 | 46,610 | - | 807,440,987 |
| **සමුච්චිත ක්ෂය** | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | 395,981 | - | - | 395,981 |
| මෝටර් වාහන | 4,562,891 | - | - | 4,562,891 |
| ලීබඩු, උපකරණ හා සවිකිරීම් | 4,415,319 | 169,865 | - | 4,585,184 |
| මේවලම් හා උපකරණ | 288,630 | - | - | 288,630 |
| | 9,662,821 | 169,865 | - | 9,832,686 |
| **ශුද්ධ පොත් අගය** | **797,731,556** | | | **797,608,301** |

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතුව මුළු ඒකතුව අක්කර 751ක් වූ ඉඩමක් තිබෙන මුත් ඒය මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර නොමැත.

මින් අක්කර 231ක් පිඹුරුපත් අංක ඒ 2099 යටතේ රජයෙන් ලද ඉඩමකි. ඒම ඉඩම පවරන ලද්දේ 1960 ජූලි මස 08වන දින නිකුත් කරන ලද රජයේ ගැසට්පත්‍ර අංක 12,156 මඟිනි. කර්මාන්තශාලාවන්, පරිපාලන ගොඩනැගිලි සහ තෙල් ටැංකි සංකීර්ණය මෙම ඉඩම තුල ඉදිකර ඇත. ඉතිරි ඉඩම් ප්‍රමාණය පිඹුරුපත් අංක ඒ 1557, ඒ 1487, ඒ 1562 සහ ඒ 2438 යටතේ වූ ඉඩම් වේ. මෙම ඉඩම් අත්පත් කරගැනීම සම්බන්ධයෙන් ලංකා රජය විසින් 1964 දී නිකුත් කරන ලද ගැසට් අංක 14,012 යටතේ වන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 460වන පරිච්ඡේදය අදාළවේ.

පෙරදී මෙම ඉඩම පහත නම් සඳහන් කර තිබෙන රජයේ ආයතන වෙත ලබා දීමට කටයුතු සිදු කරන ලද අතර මේ පිළිබඳ අවසන් තීරණය ලබා ගැනීම සඳහා විශේෂ කමිටුවක් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ස්ථාපිත කර ඇත.

| **ආයතනයේ නම** | **ප්‍රමාණය (අක්කර)** |
|---|---|
| ශ්‍රී ලංකා යුධ හමුදාව | 50 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 50 |
| ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම (බදු ගිවිසුම) | 06 |
| ගැසට් පත්‍රයේ නියෝගය අනුව අවතැන්වූ වූ පුද්ගලයින් සඳහා | 45 |
| අනවසර පදිංචිකරුවන් සඳහා | 50 |
| පරිසරහිතකාමී කර්මාන්තපුරයට | 330 |

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පේ පිහිටා තිබෙන හිමිකම් ඔප්පු අංක :2354 යටතේ සංස්ථාව සතු වූ ඉඩම අක්කර 06කින් යුක්තවේ. සංස්ථාවේ අනුමැතියකින් තොරව සුනාමි නිවාස , ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මුල් වී ඉදිකර ඇති බැවින් ඉදිරියේදී මීට සුදුසු වන්දි මුදලක් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

කොල්ලුපිටියේ පිහිටි පර්චස් 87.9කින් යුතු ඉඩම , ලංකා රජය විසින් 1967 ජූලි මස 12වන දින නිකුත් කල ගැසට් අංක : 14,756/7 මඟින් සංස්ථාව වෙත ලබා දී ඇත. මෙම ඉඩම 2013 හා 2017 යන වර්ෂවලදී පිළිවෙළින් රු.712,500,000/-ක් හා රු.735,000,000/-ක් ලෙස ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර ඇත. මෙම ඉඩම උගස් බැඳුම්කර අංක.2426 යටතේ රු.172,000,000/-ක් දක්වා ණය පහසුකම් ලබා ගැනීමට 2008.02.25 වන දින උගස් කර ඇත. 2018 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන තුල මෙම ඉඩමේ වටිනාකම ආයෝජන වත්කම් යටෙත් නිරූපණය කර තිබෙන අතර ඒහි වටිනාකම දේපල ,පිරියත හා උපකරණ යටතේ වූ ඉඩම් තුල 2019 වර්ෂයේ සිට ප්‍රකාශ කර ඇත.

1977 සැප්තැම්බර් 20වන දින ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට්පත්‍ර අංක .283/2ට අනුව ඛණිජ ද්‍රව්‍ය නිධියක් සහිත ඉඩමක් ලංකා සිමෙන්ති සංස්ථාවට අවරා ඇත. ඒහි භූමි ප්‍රමාණය අක්කර 5,413 රූඩ් 6 පර්චස් 3කින් යුක්ත වේ. මෙම සම්පූර්ණ ඉඩම පුත්තලම සිමෙන්ති (පෞද්ගලික) සමාගමට 1993 සිට වර්ෂ 50ක කාල සීමාවක් සඳහා ගිවිසුම් අංක.495 යටතේ හුණුගල් කැණීම් කර සිමෙන්ති නිෂ්පාදනය සඳහා බදු පදනම යටතේ ලබා දී තිබෙන අතර ඒම සමාගමේ නම හොලිසීම් සිමෙන්ති ලංකා (පෞද්ගලික) සමාගම ලෙස නම වෙනස් කර වර්තමානය වන විට සියාම් සිටි සිමෙන්ති ලංකා (පෞද්ගලික) සමාගම ලෙස ඒහි නම භාවිතා කරනු ලැබේ. 2019 නොවැම්බර් මස ඒම සමාගම සමඟ අත්සන් කරන ලද අංක.268 දරණ අතිරේක බදු ගිවිසුම මඟින් බදු වාරිකය සඳහා වැඩිවීම් ප්‍රතිශතයක් හා කාල පරාසයක් ඊට ඇතුලත් කර ඇත.





**මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විස්තරාත්මක සටහන්**
**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

ඉහත සඳහන් කරන ලද ඉඩමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රකාශ කර නොමැත. ඒහි වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලද විගස සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සමෙන්ති සංස්ථාවට අයත් අක්කර 12 : රූඩ් 3: පර්චස් 30කින් යුත් පුත්තලම පාලාවිහි පිහිටි ඉඩම සියාම් සිටි සිමෙන්ති සමාගමට කල්බදු පදනම මත අත්සන් කරන ලද ගිවිසුම් අංක : 26 යටතේ 2003.06.06 දින ලබා දී ඇත.

පුත්තලම පාලාවිහි පිහිටි අක්කර 221කින් යුතු ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු ඉඩමේ අක්කර 170 : රූඩ් 3: පර්චස් 28.3ක් 2013 වර්ෂයේදී තක්සේරු කල අතර එය ගිණුම්ගත කර ඇත. ඉතිරි අක්කර 51ක ප්‍රමාණය තක්සේරුකර ගිණුම්ගත කර නොමැත.

| | | 2020 | 2019 |
|---|---|---|---|
| **04.** | **විකිණීම සඳහා තබා ඇති වත්කම්** | රු. | රු. |
| | දුම්රිය ඒන්ජිම් | 750,000 | 750,000 |
| | | **750,000** | **750,000** |
| **05.** | **දිගුකාලීනව ලැබිය යුතු දෑ** | | |
| | ලංකා සිමෙන්ති සමාගම ස්ථාපිත කිරීමට අදාළ දිගු කාලීන හා කෙටි කාලීනව ලැබිය යුතු වු දෑ | 360,311,323 | 360,311,323 |
| | ලංකා සිමෙන්ති සමාගම හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව අතර සිදු වු අභ්‍යන්තර ගනුදෙනු සඳහා ලැබිය යුතු වු දෑ | 396,912,560 | 396,912,560 |
| | අවිනිශ්චිත ලැබිය යුතු දෑ වෙනුවෙන් කරන ලද වෙන්කිරීම් | (757,223,883) | (757,223,883) |
| | | - | - |
| **06.** | **ආයෝජන වත්කම්** | | |
| | භාණ්ඩාගාර බිල්පත් | 7,008,828 | 6,706,355 |
| | ***පරිපාලිතයන් සහ ආශ්‍රිතයන්ගේ ආයෝජනයන්*** | | |
| | පරිපාලිත - ලංකා සිමෙන්ති සමාගම | 617,662,779 | 617,662,779 |
| | මහවැලි මෙරීන් සිමෙන්ති (පෞද්ගලික) සමාගම | 6,400,000 | 6,400,000 |
| | | **631,071,607** | **630,769,134** |

ලංකා සිමෙන්ති සමාගම වෙනමම වු කළමණාකරණ මණ්ඩලයක් මගින් ඒහි පාලන හා අධීක්ෂණ කටයුතු සිදු වන අතර ඒහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තුන්දෙනෙකු පරිපාලකයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්වේ.
ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ සභාපතිතුමන් මහවැලි මෙරීන් සිමෙන්ති (පෞද්ගලික සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| **07.** | **තොගය** | | |
| | කොන්ක්‍රීට් නිෂ්පාදන අංගනයේ අමුද්‍රව්‍ය හා නොනිමි වැඩ | 238,256 | 238,256 |
| | | **238,256** | **238,256** |
| **08.** | **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ** | | |
| | වෙළඳ ණයගැතියන් | 48,395,643 | 49,072,035 |
| | අඩමාණ ණය වෙන්කිරීම් | (977,166) | (977,166) |
| | ලැබිය යුතු කුලී | 3,092,621 | 2,376,670 |
| | අත්තිකාරම් මුදල් – දේශීය ඇණවුම් මත | 1,131,622 | 1,131,622 |
| | ලැබිය යුතු තැම්පතු | 1,624,626 | 1,624,626 |
| | සිමෙන්ති මිලදී ගැනීම් මත වු තැම්පතු | 976,971 | 976,971 |
| | ආපදා ණය/මෝටර් සයිකල් ගැනීම සඳහා වු ණය සහ විශේෂ ණය | 3,029,920 | 3,692,332 |
| | කලින් දැරූ වියදම් | 244,008 | 403,203 |
| | ලංකා සිමෙන්ති සමාගමෙන් ලැබිය යුතු දෑ | 1,253,580 | 1,253,580 |
| | විවිධ අත්තිකාරම් | 240,947 | 240,948 |
| | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දෑ | 48,000 | 48,000 |
| | ලැබිය යුතු ඒකතු කල අගය මත බදු | 9,935,654 | 9,935,654 |
| | ලැබිය යුතු ආර්ථික සේවා බදු | 126,758 | 126,758 |
| | ලැබිය යුතු රඳවා ගැනීම් මත බදු | 4,014,641 | 5,523,571 |
| | ලැබිය යුතු ආදායම් බදු | - | 761,123 |
| | ලැබිය යුතු පොලී | 206,754 | - |
| | ලැබිය යුතු ඒන්.ඒච්.ඩී.ඒ. | 672,706 | 672,706 |
| | | **74,017,285** | **76,862,633** |





| | | 2020 | 2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **09.** | **මුදල් හා මුදල් සමාන දෑ** | | |
| | බැංකුවේ තිබෙන මුදල් | | |

| | | |
|---|---:|---:|
| ලංකා බැංකුව, ලේක් විව් ශාඛාව | 397,868 | 1,698,236 |
| ලංකා බැංකුව, ආයතනික ශාඛාව | 4,412,985 | 2,375,937 |
| මහජන බැංකුව, ලිබර්ටි ප්ලාසා ශාඛාව | 1,342,736 | 2,606,628 |
| කෙටිකාලීන තැම්පතු | 57,367,759 | 20,263,804 |
| | **63,521,348** | **26,944,605** |

**10. පොලී ගෙවිය යුතු වගකීම්**

| | | | |
|---|---|---:|---:|
| බැංකු ණය | | | |
| ණය අංකය - 83124176 | - කෙටිකාලීන වගකීම | 9,000,000 | 6,000,000 |
| | - දිගුකාලීන වගකීම | 58,700,000 | 67,700,000 |
| | | **67,700,000** | **73,700,000** |

2017.10.10 වන දින සංස්ථාව විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව ලංකා බැංකුවට ගෙවිය යුතුව තිබූ රු. 97,700,000/-ක බැංකු පහසුකම් මාස 120ක නැවත ගෙවීම් කිරීමේ කාලයක් සහිත ණය අංකය - 83124176 යටතේ නැවත සකස් කරන ලදි.

**11. ගෙවිය යුතු බැංකු ණය පොලී**

| | | |
|---|---:|---:|
| ගෙවිය යුතු බැංකු ණය පොලී | 451,421 | 710,892 |
| | **451,421** | **710,892** |

**12. දිගුකාලීනව ගෙවිය යුතු දෑ**

| | | |
|---|---:|---:|
| භාණ්ඩාගාර අත්තිකාරම් | 492,426,190 | 492,426,190 |
| | **492,426,190** | **492,426,190** |

**13. විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම්**

| | | |
|---|---:|---:|
| ආරම්භක ශේෂය | 4,674,578 | 4,012,83 |
| වර්ෂය තුල කල ගෙවීම් | - | - |
| ඉතිරිව තිබෙන ශේෂය | 4,674,578 | 4,012,83 |
| වර්ෂයට අදාළ වෙන්කිරීම් | 844,724 | 661,740 |
| **වර්ෂ අවසාන දිනට විශ්‍රාම පාරිතෝෂිත වෙන්කිරීම් ශේෂය** | **5,519,302** | **4,674,578** |

**14. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

| | | |
|---|---:|---:|
| වෙළඳ ණයහිමියන් | 3,090,311 | 3,090,311 |
| සිමෙන්ති සඳහා වූ අත්තිකාරම් | 1,079,410 | 1,079,410 |
| උපචිත වියදම් | 3,760,237 | 3,008,221 |
| බී.සී.සී. ආයතනයට ගෙවිය යුතු කුලී | 766,150 | 766,150 |
| ඒස්.ඉ.සී. ආයතනයට ගෙවිය යුතු කුලී | 3,572,724 | 3,822,724 |
| නැවත ගෙවිය යුතු තැම්පතු | 1,281,626 | 1,253,126 |
| ගෙවිය යුතු ආර්ථික සේවා බදු | 126,756 | 126,756 |
| ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු | 1,881,255 | 1,984,046 |
| වැටුප් පාලන ගිණුම | 140,753 | 185,755 |
| නොගෙවූ වැටුප් | 51,645 | 51,645 |
| රඳවාගත් කාසි | 468 | 468 |
| ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් සඳහා වූ දායක මුදල් | 135,254 | 129,103 |
| ගෙවිය යුතු සේවක භාරකාර අරමුදල් සඳහා වූ දායක මුදල් | 18,550 | 17,711 |
| ගෙවිය යුතු අධ්‍යක්ෂ පාරිතෝෂිත | 2,287 | 2,287 |
| ගෙවිය යුතු ආදායම් බදු | - | - |
| ගෙවිය යුතු ඒකතු කල අගය මත බදු | 12,366,678 | 12,907,750 |
| ගෙවිය යුතු රඳවාගැනීම් බදු | - | 8,250 |
| | **28,274,104** | **28,433,713** |





| | **2020** | **2019** |
|---|---:|---:|
| | රු. | රු. |
| **15. ආදායම** | | |
| කොන්ක්‍රීට් කණු විකුණුම් | - | 576,431 |

| | | |
|---|---|---|
| හුණුගල් සහිත ඉඩම සඳහා ලද බදු මුදල් | 57,881,623 | 59,182,276 |
| ඉඩම්වලින් ලද ආදායම් | 4,424,070 | 4,803,740 |
| (-) ජාතිය ගොඩනැගීමේ බදු | - | (1,255,630) |
| | **62,305,693** | **63,306,817** |

**16. වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සේවක ණය මත පොලී | 113,366 | 169,035 |
| තැම්පතු මත පොලී | 4,192,841 | 2,680,534 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී | 423,924 | 543,079 |
| විවිධ ආදායම් | 25 | 25 |
| ඉඩම්වලට ඇතුල්වීම සඳහා වූ ගාස්තු | - | 3,652,516 |
| | **4,730,156** | **7,045,189** |

**17. මූල්‍ය වියදම**

| | | |
|---|---|---|
| බැංකු අයිරා පොලී | 3,000 | - |
| බැංකු ණය පොලී | 7,452,517 | 11,539,256 |
| | **7,455,517** | **11,539,256** |

**18. බදු පෙර ලාභය**

පහත සඳහන් වියදම්/(ආදායම්) ගැලපීම් කිරීමෙන් පසු බදු පෙර ලාභය ගණනය කර ඇත.

| | | |
|---|---|---|
| සේවක පිරිවැය | 10,472,057 | 9,203,294 |
| අධ්‍යක්ෂ පාරිතෝෂිත | 1,845,770 | 3,531,187 |
| ක්ෂය | 169,865 | 97,040 |
| විගණන ගාස්තු | 425,000 | 520,000 |
| තොගහානි | - | 122,101 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 844,724 | 661,740 |

**19. රඳවාගත් ඉපැයුම් සඳහා කරන ලද පෙර වර්ෂ ගැලපුම්**

| | | රු. |
|---|---|---|
| **2019/12/31 දිනට රඳවාගත් ඉපැයුම් ගිණුමේ ශේෂය** | | **(604,820,972)** |
| ප්‍රත්‍යාගණන සංචිත | (177,500,000) | |
| විදුලි වියදම් | 8,249 | |
| තැපැල් වියදම් | (5,000) | |
| සුභසාධන වියදම් | (29,592) | |
| බැංකු ණය පොලී | (49,066) | |
| විගණන ගාස්තු | 156,368 | |
| දුරකථන වියදම් | (12,219) | |
| | | (177,431,260) |
| **2020/12/31 දිනට රඳවාගත් ඉපැයුම් ගිණුමේ ශේෂය** | | **782,252,232** |

මෙම මූල්‍ය ප්‍රකාශන 2021 මාර්තු මස 29 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කල අතර නිකුත් කිරීමටද අනුමැතිය ලබාදෙන ලදි.



**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | | 2020 | 2019 |
|---|---|---|---|
| | යොමුව | රු. | රු. |

| | | | |
|---|---|---|---|
| ආදායම | | 62,305,693 | 63,306,817 |
| විකුණුම් පිරිවැය | **A** | - | (565,129) |
| **දළ ලාභය** | | **62,305,693** | **62,741,688** |
| අනෙකුත් ආදායම් | **B** | 4,730,156 | 7,045,189 |
| බෙදාහැරීම් වියදම් | **C** | - | - |
| පරිපාලන වියදම් | **D** | (18,861,766) | (18,897,716) |
| **මූල්‍ය වියදම්වලට පෙර ලාභය** | | **48,174,083** | **50,889,161** |



**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | 2020 | 2019 |
|---|---|---|
| | **රු.** | **රු.** |

| | | | |
|---|---|---|---|
| **A.** | **විකුණුම් පිරිවැය** | | |
| | සිමෙන්ති මළු විකිණීම | | |
| | ආරම්භක තොගය | - | - |
| | මිලදී ගැනුම් හා අනෙකුත් සෘජු වියදම් | - | - |
| | **අඩුකලා : අවසන් ශේෂය** | - | - |
| | | - | - |
| | කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන විකිණීම | | |
| | ආරම්භක තොගය | - | 687,230 |
| | මිලදී ගැනීම් | - | - |
| | සෘජු වියදම් | - | - |
| | **අඩුකලා : අවසන් ශේෂය** | - | (122,101) |
| | | **-** | **565,129** |
| | | **-** | **565,129** |

| | | | |
|---|---|---|---|
| **B.** | **වෙනත් ආදායම්** | | |
| | සේවක ණය මත ලද පොලී | 113,366 | 169,035 |
| | තැම්පතු මත ලද පොලී | 4,192,841 | 2,680,534 |
| | භාන්ඩාගාර බිල්පත් මත පොලී | 423,924 | 543,079 |
| | විවිධ ආදායම් | 25 | 25 |
| | ඉඩම්වලට ඇතුල් වීමේ ගාස්තු | - | 3,652516 |
| | | **4,730,156** | **7,045,189** |

| | | | |
|---|---|---|---|
| **C.** | **බෙදාහැරීමේ වියදම්** | | |
| | මොටර් රථ සඳහා ක්ෂය වෙන්කිරීම් | - | - |
| | දැන්වීම් හා ප්‍රදර්ශන වියදම් | - | - |
| | | - | - |

| | | | |
|---|---|---|---|
| **D.** | **පරිපාලන වියදම්** | | |
| | වැටුප් හා වේතන | 7,816,936 | 6,766,499 |
| | අතිකාල | 388,257 | 331,916 |
| | සේවක අර්ථසාධක අරමුදල් | 901,746 | 822,378 |
| | සේවක භාරකාර අරමුදල් | 225,436 | 205,595 |
| | වෛද්‍ය වියදම් සඳහා කල ගෙවීම් | 532,285 | 401,751 |
| | අධ්‍යක්ෂ පාර්තෝෂිත | 1,845,770 | 3,531,187 |
| | විගණන කමිටු රැස්වීම් සඳහා වූ ගාස්තු | 37,500 | 119,000 |
| | වාර්ෂික ප්‍රසාද දීමනා | 174,600 | 147,150 |
| | තේ සහනාධාරය | 258,550 | 234,950 |
| | ආහාර සහනාධාරය | 556,200 | 457,100 |
| | වෛද්‍ය යෝජනා ක්‍රමය | 70,512 | 42,556 |
| | සුභසාඝන වියදම් | 478,367 | 570,854 |
| | නිවාස ණය පොලී | 58,518 | 61,745 |
| | කාර්යාල ලීබඩු හා උපකරණ සඳහා වූ ක්ෂය වෙන්කිරීම් | 169,865 | 97,040 |
| | කුලී | 990,020 | 1,008,150 |
| | විදුලි වියදම් | 141,898 | 250,778 |
| | තැපැල් හා දුරකථන වියදම් | 206,465 | 168,303 |
| | මුද්‍රන හා ලිපිද්‍රව්‍ය වියදම් | 355,338 | 212,551 |
| | වර්පනම් බදු | 7,546 | 6,930 |
| | පොදු වියදම් | 286,166 | 758,907 |
| | | **15,501,975** | **16,195,340** |



**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

**විස්තරාත්මක විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2020 දෙසැම්බර් මස 31න් අවසන් වර්ෂය සඳහා**

| | |
|---|---|
| **2020** | **2019** |
| රු. | රු |

| | | |
|---|---|---|
| ***පෙර පිටුව..................*** | **15,501,975** | **16,195,340** |
| ගමන් ගාස්තු | 70,031 | 38,853 |
| ඉඩම් නිරීක්ෂණ සහ අනෙකුත් වියදම් | 552,506 | 176,206 |
| කොල්ලුපිටිය ඉඩම සඳහා වු වියදම් | 545,330 | - |
| මෝටර් රථ වියදම් | 69,785 | 268,921 |
| ලේකම් ගාස්තු | 54,667 | 63,680 |
| කාර්යාල ලීබඩු අලුත්වැඩියාව | 14,750 | 50,426 |
| ප්‍රකාශන වියදම් | 9,920 | 9,330 |
| විගණන ගාස්තු | 425,000 | 520,000 |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 844,724 | 661,740 |
| ජල වියදම | 33895 | 58,252 |
| තොගහානි | - | 122,101 |
| බැංකු ගාස්තු | 107290 | 88,674 |
| කාර්යාල අලුත්වැඩියාව | - | 1,650 |
| තාවකාලීක සේවකයින් සඳහා වු ගාස්තු ගෙවීම් | 530,743 | 640,048 |
| සුළු උපකරණ වියදම් | 1,150 | 2,495 |
| උපදේශන වියදම් | 100,000 | - |
| | **18,861,766** | **18,897,716** |

| | යොමුව | | +රු . | -රු. |
|---|---|---|---|---|
| 2020 වර්ෂයේ ලාභය | **P & L** | | 40,718,566 | |
| තැම්පතු මත පොලී | **P & L** | | | 4,192,841 |
| භාණ්ඩාගාර බිල්පත් මත පොලී | **P & L** | | | 423,924 |
| ප්‍රාග්ධන දීමනාව | **Sch. I** | | | |
| ක්ෂය | **P & L** | | 169,865 | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | **P & L** | | 844,724 | |
| පාර්තෝෂිතගෙවීම් | **P & L** | | - | |
| | | | **41733155** | **4,616,765** |
| **වර්ෂය සඳහා ගලපන ලද ලාභය** | | | | **37,116,390** |
| පොලී ආදායම් | | | | 4,616,765 |
| **මුළු ව්‍යවස්ථාපිත ආදායම** | | | | **41,733,155** |
| **තක්සේරු ආදායම** | | | | **41,733,155** |
| අඩු කලා : | | | | |
| 2019 සිට ගෙන ආ අලාභ | | 37,081,958 | | |
| 2020 වර්ෂය සඳහා වූ අලාභ | | - | | |
| **මුළු ව්‍යවස්ථාපිත ආදායමෙන්** 100% | | (37,081,958) | | **(37,081,958)** |
| 2021 වර්ෂයට ගෙන යන අලාභ | | **-** | | |
| **බදුවන ආදායම** | | | | **4,651,197** |
| **මුළු බදු වියදම** | | 4,615,197 | 28% | 1,302,335 |
| 2019 සිට ගෙන ආ රඳවා ගැනීම් බදු | 5,316,976 | | | |
| 2020 වර්ෂයේදී හිලව් කල ආදායම් බදු ගෙවීම් | (1,302,335) | | | |
| | **4,014,641** | | | |
| **2021 සිට ඉදිරියට ගෙන යන බදු නිදහස් කිරීම්** | **-** | | | |
| **ගෙවිය යුතු ආදායම් බදු** | | | | - |





**ආදායම් බදු ගණනය**

**2020 තක්සේරු වර්ෂය සඳහා**

**උපලේඛනය I - ප්‍රාග්ධන වියදම්**

| | % | පිරිවැය | දීමනාව |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| **2012 ට පෙර වර්ෂ සඳහා** | | | |
| ගොඩනැගිලි | 6.67% | 395,981 | 26,412 |
| ලිබඩු සහ සවිකිරීම් | 20% | 546,564 | - |
| මෙවලම් හා උපකරණ | 12.5% | 47,330 | 5,916 |
| | | | **32,328** |
| **2019 වර්ෂය සඳහා** | | | |
| ලිබඩු හා සවිකිරීම් | 20% | 171,300 | 34,260 |
| | | | **34,260** |
| **2018 වර්ෂය සඳහා** | | | - |
| **2017 වර්ෂය සඳහා** | | | |
| ලිබඩු හා සවිකිරීම් | 20% | 140,561 | 9,375 |
| මෙවලම් හා උපකරණ | 12.5% | 7,750 | 517 |
| | | | **9,892** |
| **2016 වර්ෂය සඳහා** | | | |
| මෙවලම් හා උපකරණ | 12.5% | 30,255 | 3,782 |
| | | | **22,081** |
| **2015 වර්ෂය සඳහා** | | | |
| මෙවලම් හා උපකරණ | 12.5% | 18,180 | 2,273 |
| | | | **2,273** |
| **2014 වර්ෂය සඳහා** | | | |
| ලිබඩු හා සවිකිරීම් | 20% | 135,727 | - |
| මෙවලම් හා උපකරණ | 12.5% | 26,245 | 3,281 |
| | | | **3,281** |
| **2020 වර්සය සඳහා වූ ප්‍රාග්ධන දීමනාව** | | | **85,816** |



**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාවේ සදහන් කරුණු පිළිබඳව අදහස් දැක්වීම.**

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1.** තත්ත්වාගණනයකළ මතය

### 1.2. තත්ත්වාගණනයකළ මතය සඳහා පදනම

අ.) අඩමාණ ණය වෙන්කිරීමක් සිදු කර නොමැත. ගිණුම්කරණ ප්‍රමිතිය අනුව ඉදිරියේදි අඩමාණ ණය වෙන්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරිමට උපදෙස් ලබා දෙන ලදී.

ආ.) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සතු වාහන 03 අතුරින් මෝටර් සයිකලයක් ධාවන තත්ත්වයේ නොමැති බැවින් එය ඉවත් කිරිමට අදාළ කටයුතු සිදු කරමින් පවතින අතර ඉතිරි මෝටර් සයිකලය හා කැබ් රථය ඉදිරියේදි ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කරිමට කටයතු කරනු ලැබේ.

ඇ.) සංස්ථාවේ සම්බන්ධිත පාර්ශවයක් වන ලංකා සිමෙන්ති සමාගම පිළිබඳ තොරතුරු 2020 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරන සටහන්හි අංක 2.2 යටතේ දක්වා ඇත.
සම්බන්ධිත පාර්ශවයකට සිමෙන්ති සැපයිමට අදාළව අයකර ගත යුතු වන මෙම ශේෂයට අදාළ ගණුදෙනු වල ස්වභාවය හා අනෙකුත් තොරතුරු ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිතය ප්‍රකාරව හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඈ.) ඉහල වාණිජ්‍ය වටිනාකමක් සහිත කොල්ලුපිටියේ පිහිටි ඉඩම තුල දැනට කිසිදු ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවන බැවින් ආයෝජන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන තුරු මෙම ඉඩම දේපළ පිරියත උපකරන යටතේ දක්වා ඇත.

ඉ.) ලංකා සිමෙන්ති සමාගම විසින් ඉදිරිපත් කළ යුතු වාර්තා ඉදිරිපත් නොකිරිම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ප්‍රකාශන පිළියෙළ කල නොහැකිවි ඇත.

ඊ.) සංස්ථාවේ වත්කම් වලට අදාළව නඩත්තු කළයුතු වූ මෙම වත්කම් ලේඛනය පැරණි ගිණුම් ,ලිපි ලේඛණයන්ගෙන් ඒකරාශීකරගත හැකි තොරතුරු ඇතුලත් කරමින් 2016 වර්ෂයේදී සකස් කරන ලදී. වත්කම් ගිණුම් වල ඉදිරියට පැමිණි වටිනාකම රු.9,645,006/- වුවද තොරතුරු සොයාගත හැකි වත්කම් වල එකතුව අතර වෙනසට හේතුව වනුයේ ඒම තොරතුරු සොයා ගත නොහැකි වත්කම් වල වටිනාකමයි.

උ.) 2020 වර්ෂයට අදාළ වත්කම් සඳහා ක්ෂය ගණනය කිරීම නිවැරදිව සිදු කර ඊට අදාළ උපලේඛනයද විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
වත්කම් පංති වලට අදාළ ක්ෂය වෙනවෙනම ගිණුම් ගත කිරීමේදි, එම ක්ෂය වියදම් රු.30,000.00 ක් වැඩියෙන් ගිණුම් ගත වී ඇති බව පිළිගනිමු.
2020 වර්ෂයට බලපාන ලෙස නිවැරදි කරීම සිදුකර ,2021 වර්ෂයට අදාළ ගිණුම් පිළියෙළ කිරිමට කටයුතු කරනු ලැබේ.

ඌ.) ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව විසින් අයවිය යුතු මුදල් ලෙස දක්වා ඇත්තේ 2012 වර්ෂය දක්වා අයවිය යුතු කුලී මුදල් පමණි.
නමුත්, 2015 ජුනි මාසය දක්වා අපගේ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාවය අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය බැවින් හා කපා හැරිමක් සම්බන්ධ කිසිදු එකගතාවයක් නොමැති බැවින් අපගේ ලෙජර් ගිණුම් තුළ 2015 ජුනි මස දක්වා ගෙවිය යුතු කුලී සටහන් කර ඇත.
ශේෂ සනාථ ලිපිය හා මූල්‍ය ප්‍රකාශනයේ වෙනසට හේතුව එය වේ.

එ.) මෙහි සඳහන් කර තිබෙන නඩු දෙකට අදාළ ලිපිගොනු හා ගිණුම් පිළිබඳ සොයා බලා මීට අදාළව යම් නිවැරදි කිරිමක් සිදු කිරිමට වේ නම්, ඊට අදාළ කටයුතු ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදි සිදු කිරිමට කටයුතු කරනු ලැබේ.

ඒ.) සිමෙන්ති විකිණීමට අදාළව තව දුරටත් ලැබිය යුතු ශේෂයන් වෙළඳ ණය ගැතියන් ලෙස සටහන් කර තිබෙන අතර කොල්ලුපිටිය ඉඩමේ පවත්වාගෙන යනු ලබන වාහන රථ ගාලට අදාළ ලැබිය යුතු ශේෂයන් ලැබිය යුතු කුලී ගිණුමේ සටහන් කර ඇත.
සියළුම ණය ගැති හා ණය හිමි ශේෂ සඳහා ශේෂ සනාථන ලිපි ලබා ගැනිමට ලිපි යොමුකර තිබෙන අතර ,ශේෂයන් සනාථ කරමින් ලද ලිපි ලේඛන කිහිපයද විගණනයට ඉදිරිපත් කරන ලදී.යොමුකර ඇති සියළුම ලිපි සම්බන්ධ ශේෂ සනාථන ලිපි නැවත අප වෙත එවා නොමැත.



ඔ.) මෙම තෙල් ටැංකි වලට අදාළව ලැබිය යුතු බදු කුළිය, සංස්ථාවට ලැබිය යුතු වුවද ඉඩම් අයිතිය නිරාකරණය නොවිම හේතුවෙන් මුදල් ගෙවීම අතපසු කරනු ලබයි.අයිතිය තහවුරුකර ගැනීමේ කයුතු සිදු කරමින් පවතී.
2019.12.31 දිනට අයවිය යුතු මුදල පමණක් මෙම හෙළිදරව් කිරිම් යටතේ සඳහන් කර ඇත.
ඉදිරියේදි ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශවල ඊට අදාළ වර්ෂයේ අවසන් දිනට අදාළව ලැබිය යුතු වටිනාකම සටහන් කිරිමට කටයුතු කරනු ලැබේ.

ඕ.) 1990 වර්ෂයට අදාළ විගණන ගාස්තුව ඒ වන විට සංස්ථාව සතුව පැවති පුත්තලම හා රුහුණු කර්මාන්තශාලා විකිණීමේදි වගකීම බෙදා හැරීමක් සිදු වී තිබෙන අතර එය කුමන කර්මාන්තශාලාවෙන් ගෙවිය යුතුද යන්න තහවුරු කර ගැනිමට අවශ්‍ය ලේඛන අප සතුව නොමැත.
2004 වර්ෂයට අදාළ විගණන ගාස්තුවට අදාළ ගෙවිය යුතු ශේෂයක් ගිණුම් වල ඉදිරියට ගෙනවිත් නැත.

**2.** **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**2.2.2 නීති රිති/විධානයන්ට යොමුව**

(අ.) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ මානව සම්පත් කළමණාකරණයට අදාළ නීති රිති ඇතුළත් කාර්ය පටිපාටි පිළිබද අත්පොත සකස් කර ඇත්තේ 1976 වර්ෂයේදිය.මෙම අත්පොත සදහා 2003 වර්ෂයේ නිකුත් කර තිබෙන චක්‍රලේඛ අනුව අනුමැතිය ලබා ගෙන නොමැති බව ප්‍රකාශ කල නොහැක.

(ආ.) පිළිගනිමු.2016.07.31 දින ක්‍රියාත්මක කරන ලද ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසු සංස්ථාවේ අභ්‍යතර විගණන අංශයක් ක්‍රියාත්මක නොවීය. සංස්ථාව විසින් මෙම තනතුරු සදහා නැවත බදවා ගැනීම් සිදුකිරිමට ඉල්ලුම් කරනු ලැබු අවස්ථාවේ රාජ්‍ය ව්‍යපාර දෙපාර්තමේන්තුව විසින් ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වීමෙන් පසු එම තනතුරු සදහා නැවත බදවා ගැනිමක් සිදුකල නොහැකි බව දැනුම් දී ඇත

**2.3 අනෙකුත් විගණන නිරික්ෂණ**

(අ.) පිළිගනිමු.මේ පිළිබද රේඛීය අමාත්‍යාංශය දැනුවත් කිරීමෙන් පසු සිදුව ඇති මුදල් අක්‍රමිකතාවය පිළිබදව 2020.06.25 දින අපරාධ පරික්ෂන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කොට, එකී පැමිණිල්ල මේ දක්වා විමර්ශනය වෙමින් පවතී. විමර්ශන ප්‍රමාදය පිළිබදව කරුනු දැක්විමට 2021 වර්ෂයේ ජූලි මස පොලිස්පතිතුමා හමුවන ලදී.

(ආ.) මෙම කොල්ලුපිටියේ පිහිටි ඉඩම ඉහල වාණිජ වටිනාකමින් යුත් ඉඩමක් වන අතර ,මිශ්‍ර ආයෝජන ඵලදායි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිම නාගරික සංවර්ධන අධිකාරි පණතේ අනුමැතිය සහිතව කළ යුතු අතර රට තුළ දැනට පවත්නා තත්ත්වය හේතුවෙන් සුදුසු ආයෝජකයකු සොයා ගැනීමට අපොහොසත් වී ඇත. සුදුසු ආයෝජකයකු සොයා ගන්නා තෙක් මෙම භූමිය පිරිසිදුව තබා ගැනිම මහ නගර සභා ආඥා පණත යටතේ ප්‍රකාරව සිදුකල යුතු බැවින් මාස 03ක කෙටි කාල සිමාවකට ආයතන සදහා තාවකාලිකව රථ වාහන ගාල් කිරිමට අවසර ලබා දි ඇතත් එය ආයෝජන ව්‍යාපෘතියක් නොවේ.

(ඇ.) 1981 වර්ෂයේදී ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරිම අරමුණු කර ගනිමින් 03 වන අදියර ලෙස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය සමාගමක් ලෙස1981 වර්ෂයේදී ස්ථාපිත කර ඇත.එම සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් 62.45 % ක් සංස්ථාව සතු වන අතර 1990 ජුනි මස සිට උතුරු පළාතේ ඇති වූ යුධමය වතාවරණය හේතුවෙන් කන්කසන්තුරේ පිහිටි සියළුම කර්මාන්තශාලා වල මෙහෙයුම් කටයුතු මේ දක්වා නවත්වා ඇත.
ආයෝජනය සදහා ප්‍රතිලාභ නොලැබිමට මූලික හේතුව එය බව ප්‍රකාශ කල හැක.

(ඈ.) පසුගිය වර්ෂ කිහිපය තුළදී ලාභාංශ බෙදා හැරිය හැකි ආදායමක් මෙම සමාගම උපයා ගෙන නොමැති බව ප්‍රකාශ කර ඇත.

(ඉ.) පිළිගනිමු. රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් මෙම මුදල් ලබා ගැනිම පිළිබද සාකච්ඡා තව දුරටත් සිදු කරනු ලැබේ.

(ඊ.) ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත්ව තිබූ ගාල්ලේ,තල්පේ පිහිටි ඉඩම,සුනාමියෙන් අවතැන් වූ පිරිස් සදහා විශේෂ නිවාස ව්‍යාපෘතියක් එහි ක්‍රියාත්මක කිරීමට රජයට පවරා ගන්නා ලදී. එම ඉඩමට අදාල වන්දි ලබා ගැනීම සදහා ප්‍රාදේශිය ලේකම් විසින් නඩු අංක LA 643 දරණ නඩුව ගොනු කර ඇති අතර එකී නඩුව සදහා නව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2021 වර්ෂයේ මාර්තු මස පෙරකලාසි අත්සන් කොට භාර දි ඇත.



## වර්ෂ හතරක කාර්යසාධනය ඇගයීම

**ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව**

**මූල්‍ය තත්ව ප්‍රකාශනය**
**2016-2019 වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනට**

| වත්කම් | 2019<br>රු.'000 | 2018<br>රු.'000 | 2017<br>රු.'000 | 2016<br>රු.'000 |
|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ | 797,732 | 1457 | 1,590 | 3,887 |
| ආයෝජන වත්කම් | 750 | 796,950 | 796,950 | 773,700 |
| දිගුකාලීන ලැබිය යුතු දෑ | - | - | - | - |
| ආයෝජනයන් | 624,063 | 624,063 | 624,063 | 624,063 |
| මුලාා වත්කම් | 6,706 | 5,689 | 5,689 | 5,162 |
| | **1,429,251** | **1,428,633** | **1,428,292** | **1,406,812** |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 238 | 925 | 1,241 | 3,099 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 76,862 | 72,999 | 74,469 | 89,212 |
| කලින් ගෙවීම් කරන ලද වියදම් | - | - | - | - |
| මුදල් හා මුදල් සමාන දෑ | 26,945 | 19,867 | 9,158 | 13,687 |
| | **104,045** | **93,793** | **84,868** | **105,998** |
| **මුලු වත්කම්** | **1,533,296** | **1,522,426** | **1,513,160** | **1,512,810** |
| **හිමිකම් හා වගකීම්** | | | | |
| **හිමිකම්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 966,971 | 966,971 | 966,971 | 966,971 |
| පොදු සංචිත | 9,997 | 9,997 | 9,997 | 9,997 |
| ප්‍රත්‍යාගණන සංචිත | 561,203 | 561,203 | 561,203 | 536,119 |
| රඳවාගත් ඉපැයුම් | (138,869) | (181,899) | (197,585) | (210,289) |
| **විකිණීම සඳහා වූ වත්කම්** | (465,956) | (465,956) | (465,956) | (465,956) |
| | **933,351** | **890,317** | **874,630** | **836,842** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| දිගුකාලින වගකීම් | 560,126 | 586,126 | 492,426 | 492,426 |
| විශ්‍රාම පාරිතොශීත වෙන්කිරීම් | 4,675 | 4,013 | 3,796 | 3,298 |
| | **564,801** | **590,139** | **496,222** | **495,724** |
| **ජංගම වගකීම්** | | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 28,434 | 36,824 | 42,317 | 46,502 |
| කෙටිකාලීනව පොලී ගෙවිය යුතු දෑ | 6,000 | 4,000 | 97,794 | 97,793 |
| ගෙවිය යුතු බැංකු ණය පොලී | 711 | 1,146 | 2,198 | 21,768 |
| මුදල් හාමුදල් සමාන දෑ | - | - | - | 14,181 |
| | **35,145** | **41,970** | **142,308** | **180,244** |
| **මුලු හිමිකම් හා වගකීම්** | **1,533,296** | **1,522,426** | **1,513,160** | **1,512,810** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.

**විස්තීරණ ආදායම් ප්‍රකාශනය**

**2016-2019 වර්ෂයන්හි දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයන් සඳහා**

| | **2019** | **2018** | **2017** | **2016** |
|---|---|---|---|---|
| | **රු.'000** | **රු.'000** | **රු.'000** | **රු.'000** |
| ආදායම | 63,307 | 36,065 | 15,130 | 64,221 |
| විකුණුම් පිරිවැය | (565) | (316) | (16,215) | (66,525) |
| **දළ ලාභය/(අලාභය)** | **62,742** | **35,748** | **(1,084)** | **(2,304)** |
| වෙනත් ආදායම් | 7,045 | 15,375 | 56,555 | 91,542 |
| බෙදාහැරීම් වියදම් | - | - | (272) | (292) |
| පරිපාලන වියදම් | (18,898) | (16,883) | (20,524) | (41,172) |
| මූල්‍ය වියදම් | (11,539) | (14,652) | (16,501) | (15,704) |
| **බදු පෙර ලාභය/(අලාභය)** | **39,350** | **19,589** | **18,174** | **32,070** |
| බදු පිරිවැය | - | (3,630) | (2,877) | (369) |
| වෙනත් විස්තීරණ ආදායම් /(වියදම්) | - | - | 586 | (995,620) |
| පෙර වර්ෂ සඳහා කරන ලද ගැලපීම් | - | (271) | (3,180) | - |
| **බදු පසු ලාභය/(අලාභය)** | **39,350** | **15,687** | **12,703** | **(963,181)** |

වරහන් තුල නිරූපණය කරනුයේ අඩුකිරීම් වේ.